භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2025 ජනවාරි - පෙබරවාරි | 126 වන කාණ්ඩය - 01 කලාපය | පිටු 32 | DOP/NEWS/02/2025




# ආගම යනු කුමක්ද ?

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# සෙනෙහෙ සිතින් සැනසිල්ලෙන්...

ගී පද - කුලරත්න ආරියවංශ
තනු නිර්මාණය - රෝහණ වීරසිංහ
ගායනය - ගුණදාස කපුගේ



සෙනෙහෙ සිතින් සැනසිල්ලෙන්
එක සිතිවිල්ලෙන්
වෙමින් එකම මවකගෙ දරුවන්
නුවන් පියෙන තුරා ඉඳිමු අපි හසරැල්ලෙන්

එකම අහසකිනි කාටත් සෙවණ සැදෙන්නේ
පොළව සැවොම සම සිතකිනි උසුලා ඉන්නේ
එවන් පොළව මත යුද වැද උරුම සොයන්නේ
තරඟ වැදී නොමිනිස්කම් ඇයි මිනිසුන්නේ

බෙදුම් පවුරු සීමා මැද පිල් බැඳගන්නේ
තමන් සුව පතා අනුනට තැවුල් සදන්නේ
කෙනෙක් නසන මං සලසා කෙනෙක් දිනන්නේ
ජීවත් වන ටික ඇයි මේ සටන් වදින්නේ

ජයලත් මනෝරත්නයන්ගේ "ගුරු තරුව" වේදිකා නාට්‍යයේ වදන් පෙළක් මා මතකයට නැගේ:

"අපි කොහේද මේ යන්නේ... රට කොහේද මේ යන්නේ... කොතැන තිබෙන වරදක්දෝ... කවුරු කරපු වරදක්දෝ... කවදා කොතැනක කවුරු කරපු වරදක් දෝ..."

'ධර්මද්වීපය' ලෙසින් රටවැසියන් විසින්ම හඳුන්වාගනු ලැබුවත්, අදටත් අප ජීවත් වන්නේ අධාර්මික භේද රැසක් කරපින්නාගෙන යන දේශයක නොවේද? දශක තුනකට ආසන්න කාලයක් පුරා මෙරට කුරිරු යුද ගැටුම් පැවති සමයේ කුලරත්න ආරියවංශයන් විසින් රචිත "සෙනෙහෙ සිතින් සැනසිල්ලෙන්" ගීතය, ඉන් වසර ගණනාවකට පසු දිවි ගෙවන අපටද, හෙට බිහිවන මතු පරපුරටද කාලෝචිත වන්නේ එබැවිනි.

ජාති, ආගම්, කුල, පන්ති, පක්ෂ, තරාතිරම් වශයෙන් "බෙදුම් පවුරු සීමා මැද පිල් බැඳ නොගෙන", එකිනෙකාට ගරු කරමින් සිරිලක් මවගේ දූදරුවන් ලෙස ජීවත් වන්නට මේ ගීතය අපට ඇරයුම් කරයි. කෙටි කාලයකට නොව, "නුවන් පියෙන තුරා" මේ පින්බිමේ ප්‍රීතියෙන් විසීමට හැකි එකම මඟ එය බව රචකයා පසක් කරයි.

වත්මන් සමාජය දෙස තෙවැනි ඇසකින් බලන්න. තම පෞද්ගලික සුඛ විහරණය පතා අනිකාගේ ජීවිත පවා අවදානමේ දමන්නට තරම් අපි අමානුෂික වී සිටිමු. තවමත් ආන්දෝලනයට තුඩු දෙන බාල බෙහෙත් මාෆියාව එයට එක් නිදසුනක් පමණි.

තමන් සුව පතා අනුනට තැවුල් සැදුවත්, කෙනකු නසන මං සලසා තවෙකෙක් දිනන්නට වෙර දැරුවත්, අප ජීවත් වන්නේ ඉතා කෙටි කලක් බව සිහිපත් කරමින් ආරියවංශයන් මේ සාරවත් ගී රචනය අවසන් කරන අයුරු ප්‍රශස්ත වේ.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2025 ජනවාරි - පෙබරවාරි**


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කවරය නිර්මාණය**

අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**

ආනන්ද නාගහගේ

**මුද්‍රණය**

එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 ආගමට සොයමු අරුතක්... බුද්ධික සඳරුවන්

7 ආගම යනු කුමක්ද? - මලින්ත බෝපෙආරච්චි

9 ආවේගයන් සහ ... - සපුගස්කන්දේ රංජිත්

11 ප්‍රසිද්ධිය ... - ඥානදීපම් (ගෙත්සි) ෂන්මුගම්

13 ප්‍රවීණ කිතුනු ලේඛක... - කැලිස්ටස් ජයමාන්න
මොකටද හේද ... - කීර්ති සඳරුවන් ප්‍රනාන්දු

14 වෙඩි බෙහෙත් අහිංස... - තීක්ෂණ පෙරේරා

15 භක්ති ප්‍රබෝධනයට කවි - ප්‍රියංග ජයසූරිය

16 සත්‍ය සිදුවීමක් ... - මුදිතා චන්දිමා දසනායක

17 කෙටි කතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති

19 දිවියේ මට දුන් ... - දිලක්ෂි ශිරන්‍යා රුද්‍රිගු

20 කාව සිත - චමත් බි. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

21 **Do we ...** - Udugampolage Gihan Fernando

23 ආදරයේ හා ... - ජේ. එල්. සඳුනි වාසනා පීන්තු
සාමය ඇති කරමු - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු

24 ආගම යනු මේයැයි ... - පස්කල් ජයමාන්න
ආගම යනු - අයිරින් කොස්තා

25 ඕං එහෙනං - සූරිය මාමා

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 83
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 81 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

ආගම යනු කුමක්ද යන්න අංශු මාත්‍රයකවත් නොදැන, හුදෙක් වත්පිළිවෙත් සමුදායකට පමණක් සීමා වී, අනවබෝධයෙන් ආගම් පසුපස හති ලමින් දුවන සමාජ සංස්කෘතියක වත්මන වන විට බහුතර ජන පිරිසක් මුල් බැසගෙන ඇත. එසේම ජනතාව ආගම දහම අත්හරින්නටත්, ආගම්වල පරිහානියටත්, ප්‍රධානම හේතු සාධකය වී ඇත්තේද ඒ අනවබෝධයම නොවේද? ඇත්තෙන්ම ආගමක් යනු ඕනෑම පුද්ගලයකුට සැබෑ ආධ්‍යාත්මික ජීවිතයකට පිවිසීමට නිසි දිශානතිය පෙන්වන මාලිමාවක් ලෙස උපමා කළ හැකිය. ඉතින් මෙවර කවරයේ කතාව පාඨක ඔබට ආරාධනා කරන්නේ ආගමක ඇති බාහිර වත්පිළිවෙත් මතම පමණක් පදනම් නොවී, ආගම දහම මෙවලමක් කර ගනිමින් සැබෑ ආධ්‍යාත්මික ජීවිතයක ගැඹුරින් ගැඹුරට මුල් බැස ගන්නටයි.

**අචල රූපසිංහ**

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

හෙළිදරව්ව

# ආගම යනු කුමක් ද?

★ ආගම

ආගම යන වචනය සංස්කෘත වචනයකි. ආගම යන වචනයේ වචනාර්ථය දෙස බලන විට එහි අර්ථය "පැමිණීම" "සම්ප්‍රාප්තිය", කුමන දෙයක කුමන ආකාරයක පැමිණීමක්ද? ධර්ම ඉගැන්වීම්, සාම්ප්‍රදායික ඉගැන්වීම්, ධර්ම ග්‍රන්ථ, පොතපත, වත්පිළිවෙත්, මේ ආදි විවිධ දේවල අවබෝධය කෙනකුට ලැබීමයි, පැමිණීම යනුවෙන් අදහස් කරන්නේ. මානව විද්‍යාවේ හැදෑරීමේ වර්ධනයත් සමග ඇදහිලි ක්‍රම, පූජා විධි යනාදිය ආගම යන වචනයෙන් අර්ථකථනය වේ.

ඇත්තෙන්ම ආගම (Religion) යන්න කුමක් දැයි අසන ප්‍රශ්නයට නිර්වචනයක් සෙවීමේදී එය තරමක් අපහසුය. ඊට හේතුව වන්නේ සියලු ආගමිකයන් එකඟ වන පොදු නිර්වචනයක් සොයා ගැනීම අපහසු නිසාය. ඒ ඒ ආගම්වල තිබෙන්නා වූ විවිධත්වය සහ සමහර ආගම්වල තිබෙන මූලික සිද්ධාන්ත තවත් ආගමක අප්‍රධාන හෝ නොසලකා හරින කාරණයක් සේ දැකිය හැකිය. "උදාහරණයක් වශයෙන් ථේරවාදී බුද්ධාගමේ දේව යන සංකල්පයට ඉතා පහත් තැනක් හිමිවේ. චාරිත්‍රානුකූල නමස්කාරය හැමෝගේම ලක්ෂණයක් විය හැකිය. එහෙත් සමහර ආගම්වල චාරිත්‍රයට තැනක් හිමි නොවේ. මේ කරුණු නිසාම විධිමත් ලෙස ආගම් හැදෑරීම් අපහසු වී ඇත" (**දේව වේදය අකරාදිය; ජී.පී.වී සෝමරත්න පිටු අංක 151**). එය එසේ වුවත් ආගමක් ඇදහීමේ පවිත්‍ර චේතනාව පෙරදැරි කරගෙන මා ලැබූ දැනුම සහ අත්දැකීම් මත ආගම කුමක්ද යන්න මෙලෙස විග්‍රහ කරන්නට කැමැත්තෙමි.

**කිසියම් පුද්ගලයකු තම හෘද සාක්ෂියට එකඟව, ඇදහිල්ලේ පදනම මත පිහිටුවා, මනුෂ්‍ය වටිනාකම් අබිබවා හෝ ඉක්මවා මෙලොවේදී මෙන්ම මතු පැමිණෙන ජීවිතය සදා පිරිපුන් තත්ත්වයකට පත් කර ගැනීමට කෙනකු තුළ පවතින පරම අභිලාෂය හෙවත් හදවතින්ම ඇතිවන කැමැත්ත සහ ආශාව නිසා තමන් කරන කැප කිරීම ආගම වේ.**

★ පොදු ධර්මතා

ඕනෑම ආගමකට පොදු ධර්මතා ගණනාවක් ඇත. ඉන් සමහරක් මෙලෙස ඉදිරිපත් කළ හැකිය.

- මිනිසාගේ උත්තරීතරත්වය අවබෝධ කරගන්නට රුකුලක් වීම සහ ඊට සාධාරණත්වයක් ඇති කිරීමට ක්‍රියාත්මක වීම.
- ආධ්‍යාත්මික තෘප්තියක් සහ සංහිඳියාවක් ලබන්නට ආගම මාර්ගයක් වීම.
- ප්‍රේමය, මෛත්‍රිය, දයාව, මෙත්තා, මුදිතා, කරුණාව, සමගිය, චිත්ත ධෛර්යය, ආත්ම දමනය, සංවරය, ඉවසීම, අවංකකම වැනි ධාර්මික ගුණාංග මත තම ජීවිතය පිහිටුවා ගන්නට උපකාර වීම.
- කෙලෙස්, ආශා, තෘෂ්ණා, තණ්හාව, ආත්මාර්ථකාමිත්වය නසන්නට හෝ අවම කරන්නට පුද්ගලයාට පැහැදීමක් සමඟ ප්‍රවේශයක් දීම.
- ජන සමාජය තුළ භේද භින්න වීම, ද්වේෂය, ක්‍රෝධය, පලිගැනීම, කුලල් කා ගැනීම, ගහමරා ගැනීම, සොරකම් කිරීම, අසාධාරණ ලෙස මුදල් ඉපයීම, විනයක් නැති ජීවිතය වැනි වැරදි හෝ නපුරු ජීවිත රටාවෙන් බැහැර වන්නටත්, සතුට, සාමය, සහජීවනය, සහකම්පනය, පරාර්ථකාමිත්වය වැනි විශේෂ ගුණාංග සමාජය තුළ ප්‍රවර්ධනය කර ගැනීමටත් අත හිත දීම.
- අසරණයන්ට, දිළිඳුන්ට, විවිධ වෙනස්කම් ඇති මනුෂ්‍යයන්ට, විධිමත් අධ්‍යාපනයක් නොලැබූ අයට, ගිලනුන්ට, උදවු උපකාර කරන්නට සහ දන්දීමට අනුබලයක් සහ තල්ලුවක් දීම.
- මරණින් පසු සදාකාලික ජීවිතයක් හෝ පරම සත්‍යය සොයා යන්නට හෝ ශූන්‍ය තත්ත්වයකට ජීවිතය ගෙන යාමට මෙහෙයවන මාර්ගෝපදේශයක් වීම.

★ **මිනිසුන්ට ආගමක් නැති වුවහොත්?**

සමාජ විද්‍යාඥයන්ගේ අදහස වනුයේ ආගම මූලික මානුෂික අවශ්‍යතාවක් සපුරාලන සංස්ථාවක් බවය. මිනිසාට එදිනෙදා මුහුණ දෙන්නට තිබෙන

ප්‍රශ්න, ගැටලු, අභියෝග, අවිනිශ්චිත සිදුවීම්වලට මුහුණ දීමේදී ආගම දැවැන්ත කාර්යයක් සිදුකරනවා යන්නය. අසමාදානය, බිය, අවිනිශ්චිත ස්වභාව කම්කටොලු, ලෙඩ රෝග, ස්වාභාවික ව්‍යසන වන නියඟ, සුනාමි, ගංවතුර, වසංගත ආදිය, මිනිසා විසින්ම නිර්මාණය කරන ගැටුම් සහ යුද්ධ, සිත් කම්පා කරවන සිද්ධි, ආතතිය, පවුල් අවුල් වීම, සිත් තැවුල්, කලකිරීම් සහ මරණය මේ සියලු සිද්ධිවලදී ආගම සැනසීම, ඉවසීම, සංයමය සහ බලාපොරොත්තුව ඇති කර ගන්නටත්, ලෞකික මිනුම්දඬුවලින් බැහැරවී ලෝකෝත්තර වටිනාකම් ඔස්සේ ජීවිතය මෙහෙය වීමට දිශානතිය පෙන්වයි. මිනිසුන්ට උදාවෙන ප්‍රශ්න, ගැටලු, අභියෝග දෙස බලන කෝණය වෙනස් කරගන්නට, ආකල්පමය වෙනසකට අවතීර්ණ වන්නට දෙන්නාවූ සවිය අමිලය. විවිධ සිත් රිදවීම්, තුවාල, වේදනා සහ බිඳුණු සිත් සුවපත් කරගන්නට විශේෂ මෙහෙවරක් ඉටු කරයි. එනිසා අපගේ සිතුම් පැතුම්, වචන, ක්‍රියා සියල්ලෙහි ඇති ආතතිය සහ අවිනිශ්චිත ස්වභාවය තේරුම් ගනිමින් තම වචන සහ ක්‍රියා වෙනස් කර ගැනීමට හද කවුළු විවෘත කර දෙයි.

ආගමක් හෝ උසස් දර්ශනයක් තමන්ට නැති වනදා මානසික රෝගීන්, අක්‍රියව (අකර්මණ්‍යව) නොමැරී මැරුණා සේ කල්ගත කරන මිනිසුන්, ජවයක් බලාපොරොත්තුවක් නැති ඉච්චා භංගත්වයට පත් වූ මිනිසුන් දෙගුණ තෙගුණ වීම වැළැක්විය නොහැකිය. ජීවත්වීමට වුවමනාවක් නැති අතෘප්තිකර, අසුබවාදී, විෂාදය වැනි මානසික ව්‍යාකුලතාවලට මිනිසුන් ගොදුරක් වීමේ සම්භාවිතාව වැඩිය.

මෙවන් අවුල් සහගත තත්ත්වවලින් මිදෙන්නට, පාලනය කර ගන්නට, අවශ්‍ය අවබෝධය විද්‍යාත්මක දැනුම තුළින් පමණක් ප්‍රමාණවත් නොවන බව අද නිරීක්ෂණය වී ඇත. විද්‍යාව සීමිත තලයක පිහිටා තිබීම, දිනෙන් දින වෙනස් වන නිසාත්, මනුෂ්‍යයන්ගේ මානසික, සමාජීය ආධ්‍යාත්මික අර්බුදවලදී ප්‍රායෝගිකව අවශ්‍යය විසඳුම් සියල්ල එහි අන්තර්ගත නොවන නිසාත් ආගමික දැනුම, අවබෝධය, ඇදහිල්ල සහ වත්පිළිවෙත් මානව සමාජය තුළ අති ශ්‍රේෂ්ඨ කාර්යභාරයක් ඉෂ්ට සිද්ධ කරයි.

තමන් අදහන ආගමික ශාස්තෘවරුන්ගේ ධර්මය නොපිළිපදින කවරකුට වුවද ආගම පිළිවෙතකට පමණක් සීමා වෙයි. තමන් අදහන ධර්මය නොපිළිපදින්නට ජාකොබ් තුමා පවසන්නේ ඒ ඇදහිල්ල මළ ඇදහිල්ල ලෙසය (ජාකොබ් 2:17).

ක්‍රිස්තුන් වහන්සේ එය පවසන්නේ මෙලෙසය. "ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට, ස්වාමීනි, ස්වාමීනි යයි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝය" (මතෙව් 6:21).

එක්තරා සන්ධ්‍යාවක සබන් නිෂ්පාදනය කරන ව්‍යාපාරිකයෙක් සහ ආගම උගන්වන ගුරුතුමෙක් හෙවත් රබ්බි තුමෙක් ඇවිදින්නට ගියහ. සබන් සාදන ව්‍යාපාරිකයා රබ්බිට මෙලෙස පැවසීය. "බලන්න ඔබ තුමන්ලා ආගම උගන්වනවා නේද? ධර්මය පිළිබඳ පොත්පත්, සඟරා රාශියක් පළ වෙලා තියෙනවා. දහම් වැඩසටහන් ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන්, යූ ටියුබ් වලින් මිනිසුන්ට දෙනවා නේද? ආගම සම්බන්ධව වැඩසටහන් වුවමනාවටත් වඩා තියෙනවා. එහෙත්, සමාජය දෙස බලද්දී මිනිසුන් තුළ කුහකකම, තණ්හාව, බොරුව, වංචාව වැඩිවෙලා, වෛරය, ක්‍රෝධය, පලිගැනීම, කෝලහාල එමටයි. යුද්ධ නිසා මිනිස්සු දහස් ගණනින් මැරෙනවා. මරනවා එබැවින් ආගමෙන් ඇති ඵලප්‍රයෝජනය කුමක්ද?" රබ්බි ඒ මොහොතේදී කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීය. මේ දෙදෙනා තවත් ඉදිරියට ඇවිද යන විට කුඩා දරුවන් කීපදෙනකු උපන් ඇඳුමින්ම මඩ තවරාගෙන හිසකෙස් අවුල් කරගෙන හොටු පෙරාගෙන ඉතාමත් අපිරිසිදුව මිදුලක සෙල්ලම් කරන අයුරු රබ්බි තුමා දුටුවේය. එවිට ඔහු සබන් සාදන ව්‍යාපාරිකයාට ඒ දරුවන්ව පෙන්වා මෙසේ කීවේය. "බලන්න ලෝකේ හැම තැනම සබන් නිෂ්පාදනය වෙනවා, හැම තැනම සබන් මිලයට ගන්නටත් පුළුවන්. එහෙත් මේ දරුවෝ බොහොම අපිරිසිදු යි. ඉතින් සබන් සාදන එකේ තේරුම කුමක්ද?" එවිට සබන් සාදන ව්‍යාපාරිකයා පවසනවා "අප කොපමණ සබන් නිෂ්පාදනය කළත්, සබන් මිලයට ගන්න කොපමණ තිබුණත්, මිනිස්සු ඒවා අරගෙන පිරිසිදු වන්නේ නැතිනම් එහි චෝදනාව අපට දමන්න එපා". එවිට රබ්බි තුමා මෙසේ පැවසීය. "ඔබ හරි, මිනිස්සු ආගම අවබෝධ කරගෙන ඒ පණිවුඩය තම හදවත්වලට ඇතුළත් කරගෙන පණිවුඩය ජීවත් කරන්නේ නැතිනම් ඒකට අපට කරන්න දෙයක් නැත. ඔබ ඔය සබන් ගැන කියන ටිකම තමයි මට ආගම ගැනත් කියන්නට තිබෙන්නේ."

**සංස්කාරක පියතුමා**

# ආගමට සොයමු අරුතක් නව ඇසකින්

ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස අප අපගේ හිසටත් ඉහළින් ප්‍රධාන මාතෘකා දෙකක් සම්බන්ධව හරි උජාරුවට කථා ගොතති. ඒවා නම් 'ආගම' සහ 'ජාතිය' යි. සමාජයක ජීවත්වන මිනිසුන් ලෙස විවිධ සංස්කෘති ඔස්සේ ජීවත් වීමේදී සමාජයක්, රටක්, ලෝකයක් සොඳුරු නවාතැනක් බවට පරිවර්තනය කළ හැකිය. එහෙත් අද සමාජය දෙස විමසන විට ආගම් සහ ජාති නිසා සහෝදර බැඳීම් වැඩිවනවා වෙනුවට සම්බන්ධතා බිඳීම් ඉහළ ගොස් ඇත. ආදරය වෙනුවට වෛරය පැතිරේ. සමගිය වෙනුවට අසමගිය වැපිරේ. මෙයට හොඳම නිදසුන වර්ෂ 2019 දී අප සැවොම නිහඬ කරවූ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයයි. අතීත කවි කළ කිවිඳුන් රට, ජාතිය හා ආගම එක පවුලක් සේ සලකා කවිකම් කළත්, එක් ප්‍රධාන කාරණයක් අපට තවමත් අභිරහසකි. ඒ අභිරහසට පිළිතුරක් සෙවීමට අප හැම වෙහෙස විය යුතුය. මේ මාතෘකාව ඔස්සේ දිගහැරීමට බලාපොරොත්තු වනුයේ, 'ආගමට' නව අරුතකි. එසේ නම් සොයමු ඒ සඳහා අරුතක්, එක් වී අප හැමදෙනා.

ආ - ආවා
ග - ගලවන්න
ම - මමත්වය

අප සමාජයේ ප්‍රධාන ආගම් සතරකට ඉඩකඩ වෙන්ව ඇත. ඒවා නම් බුදු දහම, ක්‍රිස්තියානි කතෝලික දහම, හින්දු දහම සහ ඉස්ලාම් දහම. මේ ප්‍රධාන ආගම් සතරට ප්‍රධාන ශාස්තෘවරුන් සිව් දෙනකු සිටින බවට අප දන්නා සත්‍යයකි. එසේ නම් විමසමු ආගම යන අකුරු තුනෙහි ගැඹුරු වදනට නියම අරුතක් නව ඇසකින්.

පළමුව අප කිතු දහම දෙස හැරී බැලූ විට හැකිවේවිද සොයාගන්නට නව අරුතක්. කිතු දහම පිළිබඳව සාකච්ඡාවේදී මම ප්‍රධාන චරිත ද්විත්වයක් පිළිබඳව අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එනම්, 'දේව මෑණියන්' සහ 'ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ' ගේ චරිත දෙසයි ප්‍රථමයෙන්ම දෙව් මවුන්ගේ චරිතය විමසුමට ලක් කළහොත් මමත්වය පයට පෑගූ දෙවියන්ගේ මාතාව ලෙස ඇයව හැඳින්වුවහොත් නිවැරදි යැයි සිතමි. "මරියාවනි බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගෙන් ආශීර්වාද ලද්දෙහිය. ඔබ කුස ඔත් දරු පලයද ආශීර්වාද ලද්දේය. මේ බලන්න ඔබ පිළිසිඳගෙන පුතකු ලබන්නෙහිය. ඔහුට ජේසුස් යන නාමය තබන්න" (ශු. ලූක් සුපුවත). 'සමාජයෙන් කෙතරම් තාඩන පීඩන එල්ල වේවිද?' 'තමාට තමාගේ ජීවිතය රැක ගැනීමට හැකිවේවිද? ' මෙවැනි කිසිදු ප්‍රශ්නයක් ගැන නොසිතා තමන්ගේ මුළු දිවියම දෙවියන් වහන්සේට පුද දෙමින් ඒ කැමැත්තට 'එසේය' කියූ ඇය පුරාණ ගිවිසුම සහ නව ගිවිසුම යා කරන මඟ බවට පත්වූවාය. ඒදන් උයනේදී මමත්වය නිසා ඇති වූ පාපය සුගති උද්‍යානයේදී මෙන්ම කපාල පිටියේදී බිඳ දමන්නට මමත්වය පසකට දා දේව අභිමතයට හිස නමමින් කැඩුණු, බිඳුණු, විසිරුණු සම්බන්ධය නැවත එක් කරමින් දෙවිඳුන්ට ප්‍රසන්න වූ එතුමිය මරිය මවුන්ම පමණකි. අද සමාජයේ මම, මට, මාගේ කියා ගනිමින් තමන් පිළිබඳ පමණක් සිතන මිනිස්සු අප අතර අසීමිතය. ආදරය බිඳුණු තැන ගබ්සා බිහි කරවන ආදරය බිඳුණු තැන දික්කසාද සහතික අත්සන් කරන ආදරය බිඳුණු තැන අනියම් පෙම් පහස සොයන දරුණු, අසංවර සමාජයක ජීවත් වන ඔබට මට දේව අම්මා ආදර්ශයකි.

ස්වර්ගීය අග රැජින අප සභාවේ මාතාවන් ලෙස සලකන කිතු දහමේ පහස ලබන අප මීට වඩා වෙනස් විය යුතු නොවේද අපි එසේ පුරුදු වෙමු.

- කුරුටු ගාන විවාහ සහතික වෙනුවට දුන් පොරොන්දුව රකින්නට
- මොහොතින් මොහොත වන ගබ්සා වෙනුවට දරු උපත් නංවන්නට
- අනියම් පෙම් පහස වෙනුවට ආදරයේ නිවහනට කොටුවන්නට.

අපි 'ආගම' මමත්වය නසන උපකරණයක් කර ගනිමු. එවිට සමාජයක් සුවපත් වන බව නොරහසකි.

**"යමකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් තව කෙනකුට නැත."**(ජොහාන් 15:13)

පුරාණ ගිවිසුමේදී කිඳා බැස ගත් පාපය නව ගිවිසුමේදී මුලින් උපුටා දමන්නට ලොවෙහි මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේට අවශ්‍ය විය. ඒ අවශ්‍යතාව නවගිවිසුම තුළ දෙවි මවුන් මාර්ගයෙන් ඉටුකර ගන්නා ලදී. විශ්වය මවා වදාළ දෙවි පියාණන් වහන්සේ පුරාණ ගිවිසුමේ වලාකුළු, ගිනිදැල් සහ සුළඟ ආකාරයෙන් අදෘශ්‍යමානව වැඩ සිටියත් නව ගිවිසුම තුළ මරිය වහන්සේගේ ගැබ තුළට මිනිස් වෙසින් පැමිණ නව මසක් සුරැකිව ඉඳ මනුකය රැගෙන මෙලොව එළිය දකිනුයේ ලෝ සත පාපයෙන් එතෙර කරන පිණිසය. උන්වහන්සේ පාපයේ සිට යහපතට ගොඩවන්නට යොදාගත් පාරුව කුරුසයයි. ජුදා සමාජයේ නීච යයි සම්මත කුරුස ගස මත ජේසුස් වහන්සේ තම දැත් දෙපා දිග හැරීමත් සමඟම එය විජයග්‍රහණයේ සලකුණක් බවට පත්විය. කුරුස ගසේ සිරස් කඳින් නිරූපණය වන මාගේ කැමැත්ත තිරස් දණ්ඩ සමග එකතු වූ විට එය මමත්වය නසන ප්‍රබල අවියකි. කිතුදහමේ ශාස්තෘවරයාණන් වන අප සමිඳාණන් වහන්සේ සැම විටම ඉගැන්වූයේ අනිකා උදෙසා තම දිවි පිදීමටය. ගෙත්සෙමනි උයනේදී සැබෑ මනුෂ්‍ය වෙස්ගත් උන්වහන්සේට තමාට විඳීමට සිදුවන දුක්ගාවිනාව වැටහෙන්නට විය. "පියාණනි මේ පාත්‍රය මගෙන් ඉවත් කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබ වහන්සේගේ කැමැත්ත වේවා." (මතෙව් සුබාරංචිය) තමන් වහන්සේට මෙය දරා ගත නොහැකිය, එහෙත් පියාණන් වහන්සේ ද නිහඬය. ඒ ප්‍රබල නිහැඬියාව තුළ තමන් ගැන පවා හෝ නොසිතා දේව කැමැත්තට එකඟවීමට ක්‍රිස්තුස් වහන්සේට සිදුවිය. එම නිසා,

රජ ඔටුනු වෙනුවට කටු ඔටුනු ද,
සිංහාසන වෙනුවට නීච දඬුකඳ ද,
රාජ සළුපිළි වෙනුවට රක්ත නීල වස්ත්‍රද,

රජ බොජුන් වෙනුවට තිත්තකාඩිය ද, ගැනීමට සිදුවූයේ මමත්වය පයට පෑගීමේ උපරිමය අපට උගන්වා දෙමිනි. තමන් වහන්සේ තමන්වම පරිත්‍යාග කරමින්, යාගයද, පූජකයාද වෙමින් අපට මමත්වය නැසීමේ මඟ කියා දුන්හ. එහෙත් අද සමාජයේ ප්‍රතිචාරය කෙතරම් දුරට සාර්ථක ද ?

එක් නායකත්වයක් වෙනුවෙන් පොරකන රටක, තමන්ට වඩා අනිත් අයව උසස් කොට සලකන සමාජයක, ආදරය ලිංගිකත්වය සමාන වූ දැයක මමත්වය නැසීමට අපට හැකිද? එසේය අපට හැකිය. කිතු දහම අනුසාර කළහොත් හරි අගේට විසඳිය හැකිය.

මීළඟට අපගේ අවධානය බුදු දහම දෙසට යොමු කිරීමට උත්සාහ කළහොත් එහිත් ප්‍රධාන හරය මමත්වය නැසීමයි. එය අප පිළිවෙළකට විමසූ විට කරුණු කාරණ අවබෝධ කරගත හැකි බවට නොඅනුමානය. බුදු දහම තුළ මමත්වය නැසීම එහි ප්‍රධාන ශාස්තෘවරයාණන් වන බුදුරජාණන් වහන්සේගේ ජීවිතය ඇසුරින් පහදා දෙන්නට අදහස් කරමි.

බුදු රදුන් බුද්ධත්වය ලැබීමට පෙර සිදුහත් නමින් වූ ශාක්‍ය වංශික පුත් රුවනකි. ඔහුගේ උපතම ඉතා රාජ ශ්‍රීයෙන් ලුම්බිනි උයනේදී සිදුවිය. සාමාන්‍යයෙන් දරුවකු විසින් දෙමාපියන් සහ ගුරුවරුන්ගේ දෙපා වැඳීම සිදු වුවත්, සිදුහත් කුමරුන්ට එහි ප්‍රතිවිරුද්ධ දෙය සිදු වෙයි. ශුද්ධෝදන රජුගේ ගුරු 'අසිත පඬිවරයා' සිදුහත් කුමරුන්ගේ දෙපා වැන්දේය. එතරම් ගරු සැලකිලි ලැබූ කුමරු ට සිද්ධාර්ථ නමින් නම් තැබීම සිදු වන්නේ, "මේ පින්වත් කුමරා ගිහිගෙහි විසුවොත් සක්විති රජකු වනු ඇත. පැවිදි බිමට පත් වුවහොත් සම්මා සම්බුද්ධත්වයට පත්වනු ඇත." මේ නිසා තම පුතු පැවිදි වීමේ බිය ශුද්ධෝදන රජුට තිබීම නිසා කෙසේ හෝ සිද්ධාර්ථ කුමරාව ගිහිගෙහි රැඳවීමේ අපේක්ෂාව ඇතිව සියලු සැප සම්පත් මාලිගාවේ තැබීය. කල වයස පැමිණි විට බිරිඳක් සොයා ගැනීමේ අදිටන ඇතිව තම පුතණුවන්ගේ දස්කම් එළිදැක්වීමට උත්සවයක් සූදානම් කළේය. එහි අවසානයේදී කෝලීයවංශික ප්‍රබුද්ධ රජුගේ දියණිය වන යසෝධරාව සිද්ධාර්ථ සමග විවාහ කරලීමට කැමැත්ත පළ විය. මෙසේ කාලය ගමන් කරන විට සිදුහත් විසින් සතර පෙරනිමිති දර්ශනය කරන ලදී.

පැසුණු හිස කෙස් වලින් යුතු සම රැලි වැටී කුදුගැසුණු මහල්ලකු, ජරාවට පත් රෝගියකු, මළ සිරුරක්, පැවිදි නමක්, මේ නිසා සිදුහත් තම ජීවිතයේ යථාර්ථය සොයන්නට පටන් ගති. අවසානයේ රාහුල කුමරුවන් හට සංවිධානය

8 වන පිටුවට .....

# ආගම යනු කුමක්ද ?

ආගම යන වචනය අපට නිතර ඇසෙන වචනයකි. ඒ තරමටම මේ වදන මිනිස් ජීවිතවලට හා මිනිස් සිතුවිලිවලට බද්ධ වී තිබේ. මේ වචනය පිළිබඳව සිතීමේදී ගම්‍ය වන කරුණක් තිබේ. එනම් සියලු දෙනාටම එකඟවන්නට හැකි නිර්වචනයක් ඉදිරිපත් කිරීම අපහසු වන බවයි. එය ආශ්‍රිත විවිධාකාර මතවාද රැසක් ඇත. "ආගම පිළිබඳව මනෝ විද්‍යාත්මක අධ්‍යයනයක් යනුවෙන් මහාචාර්ය ලව්බා මහතා කෘතියක් ලියා තිබෙන අතර එහි ආගම යන්න නිර්වචන හතළිස් අටක් පමණ දක්වා තිබේ. එමගින් ඉහත සඳහන් අදහස නිවැරදි බව ප්‍රත්‍යක්ෂ වේ".

වර්ෂ 1871 දී මානව විද්‍යාඥයකු වන එඩ්වඩ් ටයිලර් ආගම යන්න හඳුන්වා දී ඇත්තේ "අති මානුෂ අද්භූතයන් කෙරෙහි පවතින විශ්වාසය" ලෙසය. එසේ වුවද මෙහිදී විශ්වාසය පමණක් නොව විවිධ පිළිවෙත්, ක්‍රම හා හැඟුම් ආදිය ද ආගමට අයත් වන බව පිළිගැනීමට සිදුවීම හේතු කොට ගෙන ඒ අදහස ද බැහැර කිරීමට සිදුවේ. ආගම ලෙස හඳුන්වන සියලු දෑ දෙස විචාරාක්ෂියෙන් හා තර්කානුකූලව බලන කල එක් කෝණයක් පමණක් පැහැදිලි වේ.

එනම් ලොව සැම ආගමකින්ම අපේක්ෂා කරන අරමුණ නම් "පරම සුවය" වන විමුක්තිය අත්කර ගැනීමය. එය සියලු ආගම්වල ඇති ප්‍රධාන සංකල්පයකි.

විමුක්තිය ලබා ගැනීමට තිබෙන මාර්ග හඳුන්වනු ලබන්නේ "විමුක්ති මාර්ග" වශයෙනි. ලෝකයේ සියලු ආගම්වලට ඒකායන අරමුණ විමුක්තිය හෙවත් ගැලවීම වුවද ඒ කෙරෙහි දක්වා ඇති විමුක්ති මාර්ගවලද විවිධාකාර බවක් ඇති බව සක්සුදක් සේ පැහැදිලිය. මේ විවිධත්වය කරුණු කොටගෙන විවිධ ආගම් ලොව තුළ පහළ විය.

ලෝකය තුළ තිබෙන ආගම් අතුරින් බෞද්ධ, ක්‍රිස්තියානි, ඉස්ලාම් හා හින්දු යනාදී ආගම්වලට මූලික ස්ථානයක් ලැබේ. සත්‍ය වශයෙන්ම මේ ආගම් සම්බන්ධව තුලනාත්මකව තොරතුරු පරීක්ෂා කර ගනිමින් මැක්ස්මූලර් බඳු පියතුමන්ලා කීප දෙනකු ඉතා වැදගත් කෘති මෙන්ම ලිපිද ප්‍රකාශ කර ඇත. ඒවා පිළිබඳව ගැඹුරින් කියවා බලන සැමට අත් කර ගත හැකි ප්‍රයෝජන ඉමහත්ය.

ඉහත දැක්වූ ප්‍රධාන ආගම් හතර ගැන ගැඹුරින් හා තුලනාත්මකව බලද්දී පසක් වන ලක්ෂණ කීපයක් තිබේ. ඒ ආගම් මූලික නිෂ්ටාවක් පිළිගැනීම හා එය ගැනීම සඳහා ප්‍රයත්න දැරීමත් එකක් ලෙස දැක්විය හැකිය. බුදු සමය තුළ නිර්වාණය හෙවත් නිවන ලෙසද, හින්දු ආගමේ බ්‍රහ්මත්වය යනුවෙන්ද, කිතුනු, ඉස්ලාම් ආගම්වල ලෝක පාලක, නිර්මාතෘ දෙවියකු ලෙසද පැහැදිලි කර තිබේ. මේ ආගම් තුළ හොඳ නරක යහපත, අයහපත පිළිබඳ කරුණු විග්‍රහ කෙරේ. එසේම බෞද්ධ, හින්දු දහම් ගැන බලන කල "කර්මය" පිළිබඳව ද, කිතුනු, ඉස්ලාම් ආගම්වල "පාපය", "දේව විනිශ්චය" සම්බන්ධවද සාකච්ඡා කෙරේ. මෙලෙස මේවායේ සමානාත්මතා රාශියක් ඇති බව සූක්ෂ්ම ලෙස බලද්දී මේවා පිළිබඳව ඒ ආගම්වලට ආවේණික විෂමතා ද දැකිය හැකි බව සඳහන් කළ හැකිය. ඒ විෂමතා උද්ගතවී තිබෙන්නේ මරණින් මතු ස්වභාව ආශ්‍රිතව සොයා බලන කලය.

ජීවිත ගමන තුළ මේ ලෝකය තුළින් බලාපොරොත්තු වන මූලික ප්‍රාර්ථනා කීපයක් ඇත. ආහාර, වාසස්ථාන, නිදහස,ගෞරවය, සෞඛ්‍යය, ප්‍රීතිය යනුවෙන් ඒවා නිරූපණය කළ හැකිය. ඒ අවශ්‍යතා සපුරා ගත් විට කායික හා මානසික අසීරුතාවලින් බොහෝ දුරට මිදී වාසය කළ හැකිය.

විද්‍යානුකූලව ද විවිධාකාර දේවල් ලබා ගැනීමට ධනය, ශ්‍රමය ලොව නිබඳවම වැය කරනු ලබන්නේ එය සාක්ෂාත් කර ගැනීමට බව තහවුරු කළ හැකිය . එසේ වුවත් කෙතරම් විද්‍යාත්මක දෑ නිපදවා තිබුණද , මනුෂ්‍යයාට කායික, මානසික අවශ්‍යතා මුළුමනින් ඉෂ්ට කර ගැනීමට නොහැකි අවස්ථාද ඇත. එවන් වාතාවරණයක් යටතේ ආගමෙහි පිළිසරණය නිරායාසයෙන් සොයායන්නට සිදුවන බව නොරහසකි. යථාර්ථයකි.

ලෝකය තුළ සැම ආගමක් ම පහළ වී තිබෙන්නේ මනුෂ්‍යයාගේ ශුභ සිද්ධිය සලස්වා දීමේ අරමුණින් යයි ප්‍රකාශ කිරීම සත්‍යයකි. ඒ ආශ්‍රිතව දක්වා තිබෙන ක්‍රමවල විවිධත්ව අනුව ආගම් අනුව බිහිවී තිබීම පුදුමයක් නොවන බව මතකයට එක් කරගත යුත්තකි. මිනිසා කුමන හෝ දහමක් වෙතට සමීප වන්නේ ඉහත සඳහන් කළ සාධාරණ අදහස් සපුරා ගැනීමට යම් ආකාරයක පිටිවහලක් දහම තුළින් ලැබෙන තාක් පමණි. එය වෙනත් අන්දමකින් සඳහන් කරන්නේ නම් සමාජයක් ලෙස හෝ පුද්ගලයන් ලෙස ආගමක් තුළින් යම් පිහිටක් නොලැබෙන්නේ නම් ඔවුන් ඒ ආගම් කෙරෙන් ඈත් වන බව දක්නට ලැබෙන දෙයකි.

යමෙක් තම බුද්ධියේ මහිමය මගින් විචාරාත්මක සෙවීම හඳුන්වන්නේ විද්‍යාව යනුවෙනි. එමෙන්ම යමෙක් තමාට නිර්මාණාත්මක හැකියාවක් මූලික කොට ගෙන දෙවිඳුන් සෙවීම කලාව ලෙස හඳුන්වා දිය හැකිය. එමෙන්ම යම් තැනැත්තෙක් සිය අධ්‍යාත්මය තුළින් දෙවිඳුන් දකින්නට වෑයම් කිරීම ආගම ලෙස සඳහන් කළ හැකිය.

**මලින්ත බෝපෙආරච්චි**
දලුගම, කැලණිය.

**ආගමට සොයමු අරුතක් නව ඇසකින්**
**6 වන පිටුවෙන්.....**

කළ උත්සවයක් අවසානයේදී, රූමත්ව රංගනයේ යෙදී සිටි නළඟනුන්, අශෝභන ලෙස අවුල් හිස කේ සහිතව, විවර වූ මුවින් යුතුව සෙම් සොටු පෙරමින් ගොරවමින් නිදා ඉන්නා දැක තම ගිහි ජීවිතය පිළිබඳව කලකිරී පැවිදි බිම තෝරා ගන්නට සිදුහත් උත්සුක විය.

රාජමාලිග හැර දා දුෂ්කර දිවියකට මං සෙවූ ඔහු, සුරූපී පින්වත් බිරිඳ හැරදා සනාතන දහමක් සෙවූ ඔහු, රාජ භෝජන වෙනුවට වන පලා අනුභව කළ ඔහු, තමන්ගේම පුතණුවන් හැරදා බුදුබව සෙවූ ඔහු, මමත්වය දූවිල්ලකට දැමූ ආකාරය වටහා දෙන්නේ නැද්ද? තමන් නොව තමන් අවට සිටින්නන් ගැන සොයා බලන්නට නොවේද මේ ඇරයුම? එසේ බුදු දහමේ ද හරය මමත්වය නැසීමයි. එහි පණිවිඩය ආත්මාර්ථයට එහා ගිය පරාර්ථයක ජීවත් වීමට කරන ඇරයුමකි. ඒ ඇරයුමට ජාති, ආගම්, කුලමල භේදයකින් තොරව සූදානම්ද?

කතෝලික, බෞද්ධ දර්ශන වල පමණක් නොව හින්දු සහ ඉස්ලාමීය දර්ශනවලද ප්‍රධාන හරය මමත්වය නැසීමයි. ආගම යනු මමත්වය නැසීමේ මගයි. එසේ නම් පරාර්ථය තුළ ආගමික සහජීවනයෙන් එක්රොක් වී මමත්වය නසා සාමය බෙදා හරිමු. ආදරය බෙදා ගනිමු.

තීරණය ඔබ අතේය. මම, මට මගේද? නැත්නම්, අපි අපට, අපේද ? විමසන්න තීරණය කරන්න.

**ආගම යනු , මමත්වය නැසීමේ මගයි.**

**බුද්ධික සඳරුවන්**
ශාන්ත අන්තෝනි දේවස්ථානය, දලුපත.

# ... ආවේගයන් සහ ආවේණිකත්වයන් ...

ආවේගයන් යනු පාරිසරික හේතු සහ පුද්ගල පසුබිම අනුව ඒ ඒ අවස්ථාවල අප තුළ බලවත් වන, නිවී යන, වෙනස් වන හැඟීම්.

ආවේණිකත්වයන් නොහොත් ජම්ම ගති යනු එසේ පහසුවෙන් වෙනස් වන හැඟීම් නෙමෙයි, පුද්ගල ස්වාභාවයි.

තම ආවේගයන් සඟවා ගෙන සිටීම අපහසු යි. තමන් නොදැනුවත්ව ම තම ආවේග යන් ප්‍රදර්ශනය වෙනවා.

එහෙත් සැඟවී පවතින බැවින් ජම්ම ගති ඉක්මනින් ප්‍රදර්ශනය වන්නේ නෑ. අධ්‍යයනයකින් තොරව හඳුනා ගැනීමත් අපහසු යි.

සමහරු නපුරුයි. යමකුගෙන් තමන්ට වූ වරදකට ඔවුන් දිගුකාලීනව රහසින් පළිගන්නවා.

තවත් සමහරු කාරුණික යි. ක්ෂණිකව කෝප වුවත් දිගින් දිගට පලිගන්නෙ නෑ.

සමහරු ඉතා ගුණමකු යි. සමහරු ඉතා කෘතවේදියි.

සමහරුන්ට වැඩියෙන්ම පෙනෙන්නේ අනුන්ගේ දුර්ගුණ සහ දුබලකම්. ඔවුන් අනුන් ගැන කලකිරීමෙන් අසතුටින් පෙළෙනවා.

තවත් සමහරුන්ට අනුන්ගේ යහගුණ සහ වටිනාකම් පේනවා.

සමහරු තමන්ගේ වැදගත්කම ගැන අධිතක්සේරුවකින් පෙළෙනවා. තවත් සමහරු ඉතා නිහතමාන යි.

"මං සුදනා" මානයෙන් පෙළෙන අය ඉන්නවා. තමන්ට එරෙහිව ඕනෑම චෝදනාවක් සඳහා නිදහසට කාරණ ඔවුන්ගේ දිව අග තියෙනවා. තම වරදක් පිළිගැනීම මහ බාල්දුවක් ලෙසයි ඔවුන්ට දැනෙන්නෙ.

නැති බැරි අයටත් වඩා මසුරු හා තණ්හාධිකවූ, ඇති නැති අයත් ඉන්නවා. එමෙන්ම අනිකාගේ දුක දැනෙන, තමාගේ සොච්චම වුවත් අනිකා සමග බෙදා ගන්නා දුප්පත් අයත් ඉන්නවා.

ඇති තැනැත්තා කෙරෙහි, නැති තැනැත්තා තුළ ඊර්ෂ්‍යාව ඇති වීම ස්වාභාවික යි. එහෙත් තමන්ට වඩා දුප්පත් අයට යම් යහපතක් වෙනවාට ඊර්ෂ්‍යා කරන අයත් ඉන්නවා. තමාට උපකාර කරන හිත මිතුරකුට වුවත් හරියනවාට ඊර්ෂ්‍යා කරන උදවියත් ඉන්නවා.

කතා කරන්නට අනුන්ට ඉඩක් නොදී සමහරු නොනවත්වාම පැන පැන කතා කරනවා. එමෙන් ම වෝල්ටෙයාර්වරුත් අප අතර ඉන්නවා.

සමහරු සහජයෙන් ම හොර හිත් ඇත්තෝ. හොරයක්, බොරුවක්, වංචාවක් සමහරු කරන්නේ කිසිසේත්ම නැති බැරිකම නිසා නෙමෙයි එසේ කිරීම තම ස්වභාවය නිසා.

සමහර නිලධාරීන් අල්ලස් නොමැතිව තම රාජකාරියේ යුතුකම් ඉටු කරන්නේ නෑ. සමහරු තම නිල බලය උපයෝගී කරගෙන තමන්ට කප්පම් නොදෙන්නන්ගෙන් පලිගන්නවා.

හෘද සාක්ෂියට එකඟව නීතිගරුකව සහ යුක්තිගරුකව රාජකාරි කරන අයත් ඉන්නවා.

අනර්ථකාරි වූ ජම්ම ගති මෙන්ම, අර්ථකාරි වූ ජම්මගතිත් පුද්ගලයන්ට තියෙනවා.

එකම පවුලේ සොයුරු සොයුරියන් අතරත් පරස්පර විරුද්ධ වූ පුද්ගල ස්වභාව දකින්න ලැබෙනවා.

පුද්ගලයන්ට විවිධ වූ චරිත ලක්ෂණ ආවේණික වන්නේ කෙසේ ද ?

පිය රජුගේ චරිත ලක්ෂණ සිදුහත් කුමරුට උරුම වූයේ නෑ.

සිදුහත් කුමරුගේ ඇසුර ලැබුණත් දේව දත්තයන්ගේ ජම්ම ගුණ වෙනස් වුයේ නෑ.

ජේසුගේ සමීප ඇසුර ලැබුණත් ජුදාස්ගේ ආවේණිකත්ව වෙනස් වූයේ නෑ.

අනර්ථකාරි වූ තම තමන්ගේ ආවේණිකත්ව හඳුනා ගැනීම පිණිස, එකිනෙකා එකිනෙකාට සහාය විය හැකි ක්‍රමවේද නැද්ද ?

කේන්දරයෙහි පුද්ගලයන්ව ගණ තුනකට බෙදනවා යක්ෂ, දේව, මනුෂ්‍ය යනුව.

කිතු දන පුබුදුවේ ගණ සම්මේලනයෙහි දී පුද්ගලයන්ව වර්ග කෙරෙන ගණ 10 ක් හඳුන්වා දෙනවා.

රාග චරිත, ද්වේෂ චරිත හා මෝහ චරිත ආදි වශයෙන් වූ වර්ගීකරණයක් ද මම අසා තියෙනවා.

මනෝවිද්‍යාඥයනුත් විවිධ පුද්ගල වර්ග හඳුන්වා දෙනවා.

තමාගේ ගණය හඳුනා ගැනීමෙන් යමකුට හැකි වෙනවා ඒ ගණයේ බලපෑමෙන් යම් පමණකට හෝ නිදහස් වීමට. ඒ ආත්මාවබෝධයේ ඌනතාව නිසා, තමා තම ගණයේ වහලකු වෙනවා.

මගේ මව ආගමට ලැදි කතෝලික බැතිමතියක්. පියා එතරම් භක්තිමත් නෑ.

ඊර්ෂ්‍යාව නමැති දුර්ගුණය මගේ මව තුළ ඉතා තදින්ම තිබුණා, මට මතක ඇති කාලයේ පටන්ම. අසල්වැසියකුගේ හෝ ඥාතියකුගේ දරුවකුට යහපතක් සිදුවීම, ඇගේ බලවත් අසතුටට හේතුවන ස්වාභාවයක් ඇය තුළ තිබුණා.

70 දශකයේ අග භාගයේ දී ඇයත් ඇගේ අක්කාත් කිතු දන පුබුදුවට බැඳුණා.

ඇය තුළ වූ ඊර්ෂ්‍යාකාරි ස්වභාවය ටික කලකින් නැත්තටම නැති වී ගිය බවත් මම අත්දැක්කා. අසල්වැසියන්ගේ සහ ඥාතීන්ගේ දරුවන්ටත් ඇය අපට වගේම කාරුණිකව ක්‍රියා කළා. ඒ සියල්ලන්ගෙන්ම ප්‍රති ආදරයත් ඇයට ලැබුණා.

එහෙත් ඇය සමග පුබුදුවට සම්බන්ධ වූ ඇගේ අක්කාගේ ගති පැවතුම්වල එවැනි වෙනසක් මම දුටුවේ නෑ.

පුබුදුවෙන් කෙරෙන ගණ සම්මේලනය සහ පවුල් උපදේශනය ඉතා වටිනා සමාජ සත්කාරයකි.

මගේ භෞතිකවාදී මිතුරන්ට අනුව නම් පුද්ගලයන්ට ජම්ම ගති නෑ. මව්පියන්ගේ ජානමය බලපෑම පුද්ගලයා කෙරෙහි යම් පමණකට බලපෑ නමුත් පාරිසරික බලපෑම් ඊට වඩා ප්‍රබලයි.

ඔවුන්ට අනුව පුද්ගලයා පරිසරයේ නිර්මාණයක්. පරිසරයට අනුගත වෙනවා මිසක් පරිසරයට අභියෝගයක් වීමේ හැකියාවක් පුද්ගලයාට නෑ. ඔවුන්ට අනුව ඕනෑම වරදකට සැබෑ වරදකරු වන්නේ සමාජ පරිසරය මිසක් පුද්ගලයා නෙමෙයි.

පුද්ගලයාගේ ආධ්‍යාත්මිකත්වය අවතක්සේරු කෙරෙන ඒ භෞතිකවාදී දෘෂ්ටිය දේශපාලන මතවාදයක්. එය අපව අධෛර්යවත් කරවමින් ආධ්‍යාත්මික අවදිවීම වළක්වන්නක්.

පරිසරය පුද්ගලයා කෙරෙහි බලපානවා වුවත් චරිත ලක්ෂණ විවිධ වීමට එකම හේතුව ආරය හා පරිසරය පමණක් වෙන්න බෑ.

සමාජයේ ශිෂ්ටකම, සදචාරය හා මානව ගුණය නැංවීමට දායක වී ඇත්තේ අධ්‍යාත්මය කෙරෙහි අවදි වූ නිදහස් චින්තන බව මානව ඉතිහාසය හැදෑරීමේදී පේනවා.

**සපුගස්කන්දේ රංජිත්**

# ප්‍රසිද්ධිය සහ ධනය සඳහා තරඟ කිරීම විහිළුවක්

*අපොයි !*
*මම මොනතරම් මෝඩද?*
*නොකඩව වැඩ කරනවාට වඩා*
*ජීවිතය භුක්ති විඳීමට අවධානය යොමු*
*කළ යුතුව*
*තිබුණා නේද?*
*ජීවිතයේ දී,*
*ඔබට නිදා ගත හැක්කේ එක ඇඳක පමණි,*
*ජීවත් විය හැක්කේ එක් කාමරයක පමණි.*
*ඊට වඩා යමක් ඇත්නම් ඒවා*
*හුදු සුඛෝපභෝගීත්වය සඳහා පමණි.*
*ජීවිත කාලය පුරාම ජීවත් වූ පසු,*
*මිනිසුන්ට අවසානයේ මෙය තේරුම් යනවා.*



ඥානදීපම් (ගෙත්සි) ෂන්මුගම්

කතුවරිය විශ්‍රාමික ලේඛිකාවකි. ඇය වැඩිහිටි නිවාසයකට යාමට සූදානම් වන අවස්ථාවේ ඇයට ඇතිවූ හැඟීම් ඇය මෙසේ විස්තර කරයි.

**උපුටා ගැනීමක්**

මම වැඩිහිටි නිවාසයකට යන්නයි සූදානම් වන්නේ. මට වෙන විකල්පයක් නෑ.

ඔබට තවදුරටත් මාව රැකබලා ගැනීමට නොහැකි නිසාත්,

මගේ දරුවන් කාර්යබහුල නිසාත්,

ඔවුන්ගේම දරුවන් රැකබලා ගැනීමට ඔවුන්ට සිදුව ඇති නිසාත්,

කිසිවකුට මා රැකබලා ගැනීමට වෙලාවක් නොමැති නිසාත්,

මට කළ හැකි එකම දෙය මෙයයි.

මේ වැඩිහිටි නිවාසය,

සරල හා ප්‍රායෝගික විදුලි උපකරණවලින් සමන්විත පිරිසිදු තනි කාමර සහිත හොඳ තත්ත්වයේ එකක්.

එහි සියලුම ආකාරයේ පහසුකම් තියෙනවා. ආහාර ඒ තරම් රස නොවූවාට,

සේවාව ඉතා හොඳය.

අය කිරීම අඩු නොවුණත්,

එහි පරිසරය ඉතා අලංකාරයි.

මගේ විශ්‍රාම වැටුපෙන් මේකට ගෙවන්න පුළුවන් කමක් නැහැ.

එහෙත් මට මගේම නිවසක් තිබෙනවා.

මම ඒක විකුණා ගත හොත් සල්ලි ප්‍රශ්නයක් නෑ. මට එය මේ සඳහා යොදා ගත හැකියි.

ඉතිරිය මගේ පුතාට දෙන්නට පුළුවන්.

පුතාට මේ ගැන ගැටලුවක් නෑ.

ඔහු මට කිව්වා,

"අම්මේ, ඔබේ මුදල් සහ දේපල ඔබ භුක්ති විඳින්න ඕනේ. අප ගැන කරදර වෙන්න එපා." යනුවෙන් !

දැන් මම මේ වැඩිහිටි නිවාසයට යාමට සූදානම් වෙන්න ඕනි.

මම සූට්කේස්, පෙට්ටි, බෑග්, කැබිනට් සහ ලාච්චුවලින් පිරුණු මේස මගේ නිවස දෙස බැලුවෙමි;

සියලු ආකාරයේ අවශ්‍යතා වලට ගත් දේවල්,

දුටු නිසා ගත් අනවශ්‍ය දේවල්,

මගේ චිත්‍ර එකතුව,

සියලු වර්ගවල ඇඳුම් පැළඳුම්,

මිල අධික ඇඳ ඇතිරිලි,

විශේෂ රිදී හැඳි ගෑරුප්පු සහ

වටිනා පිඟන් භාණ්ඩ!

මම දේවල් එකතු කිරීමට කැමතියි;

මුද්දර, පෙන්ඩන්ට්, මාල රාශියක් මා සතුව ඇත.

විශේෂයෙන්ම මම පොත්වලට ආසයි. මගේ බිත්තිවල පොත් රාක්ක පිරිලා තියෙන්නේ. ඒවායින් බොහොමයක් කියවලාවත් නැහැ.

හොඳ විදේශීය වයින් බෝතල් දුසිම් ගණනක් තියෙනවා. ගෘහස්ථ උපකරණ කට්ටල තිබෙනවා; විවිධ ඉවුම් පිහුම් උපකරණ, භාජන, කුළුබඩු මහ ගොඩක්, විවිධ සෝස්, හාල්, පැස්ටා, ශීත කළ මාළු සහ මස් වැනි ආහාර ද්‍රව්‍ය රාශියක් තියෙනවා. ඇත්ත වශයෙන්ම කියනව නම් මුළුතැන්ගෙය සහ පැන්ට්‍රිය පිරිලා!

හරියට ළමා නේවාසිකාගාරයක් පවත්වාගෙන ගිහින් වගේ!

ඊට පස්සෙ පවුලේ මතක සටහන් තියෙනවා. වීඩියෝ කැසට් දුසිම් ගණනක්, සහ ලොව පුරා විසිරී ඉන්නා ලොකු නැන්දලාගේ, ලොකු මාමලාගේ, ආච්චිලා සීයලාගේ, මාපියන්, මාමලාගේ, නැන්දලාගේ, ඥාති සහෝදරියන්ගේ, බෑනලාගේ, ලේලියන්ගේ සහ මිතුරන්ගේ ඡායාරූප ඇල්බම් 100 කට අධික ප්‍රමාණයක්. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් බොහෝ කලක සිට මේ මිහිතලයෙන් සමුගෙන. තවත් බොහෝ අය ඔවුන්ගේ සන්ධ්‍යා කාලයේ, දෙවියන් වහන්සේ ඔවුන්ව කැඳවන තෙක් බලා සිටිනවා.

මේ සියල්ල දෙස බලා මම දැඩි කනස්සල්ලට හා දුකට පත් වීමි. වැඩිහිටි නිවාසයේ මට ලැබෙන්නේ කැබිනට්ටුවක්, මේසයක්, ඇඳක්, සෝෆාවක්, ශීතකරණයක්, රෙදි සෝදන යන්ත්‍රයක්, රූපවාහිනියක්, කුකර් සහ මයික්‍රෝවේව් උදුනක් සහිත එක් කාමරයක් පමණි.

මට ඇත්තටම අවශ්‍ය සියලුම දේ තමයි ඒ.

මගේ ජීවිත කාලය පුරා එකතු කරගත් ධනය හා මනදොළ ගබඩා කිරීමට තැනක් දැන් නැහැ.

මේ මොහොතේ මට හැඟෙන්නේ මගේ ඊනියා ධනය අතිරික්තයක් බවත්, එය මට අයිති නැති බවත්ය. මම ඒවා පරිහරණය කළා පමණයි. ඇත්තටම ඒවා කාටවත් අයිති නෑ. මම මගේ යැයි කියාගත් "ධනය" අතමාරුවක් පමණි. ඒවා තවදුරටත් මගේ නොවේ. මේවා වෙන කෙනෙකුට හෝ වෙන තැනකට යාවි, දිරාපත්වී හෝ විනාශ වී නැති වෙන තෙක්.

මා වෙහෙස මහන්සි වී, දහඩිය වගුරුවා, ගොඩනැගූ නිවසට පවා මාව මතක නැති වේවි. මීළඟ අයිතිකරුවන්ට මා කවුද, මේ ගේ කොච්චර මට වැදගත් ද කියන එක පිළිබඳව අදහසක් නැති වේවි. මම මේ ගෙවත්තේ සෙවණැල්ලක් පමණක් වේවි. ඔවුන් මා හිටවපු ඇපල් ගසෙන් ඇපල් කඩාගෙන කාවි. මම හිටවපු ලස්සන මල්වල ආස්වාදය විඳීවි.

අපොයි !

මම මොනතරම් මෝඩද?

නොකඩව වැඩ කරනවාට වඩා ජීවිතය භුක්ති විඳීමට අවධානය යොමු කළ යුතුව තිබුණා නේද?

තහනම් නගරය කාගේ මාලිගයද?

අධිරාජයා එය තමන්ට අයිති යැයි සිතූ නමුත්

අද එය මිනිසුන්ට සහ සමාජයට අයත් වෙලා.

මට ඇත්තටම අවශ්‍ය මගේ නිවසේ ඇති දේවල් පරිත්‍යාග කිරීමටයි. එහෙත් එය කිරීමට හැකියාවක් මට දැන් නැහැ.

මා එකතු කරගත් දේ අගය කරන්නේ ඉතා සුළු තරුණ පිරිසක් පමණි.

බොහෝදෙනකුට මේවා කුණුගොඩවල්.

මගේ දරු-මුනුබුරු-මිනිබිරියන්ට

මම දුක් මහන්සියෙන් රැස් කරගත් මේ වස්තු ලැබුණු පසු

එය කෙබඳු වේදැයි මට සිතාගත හැකිය.

ඔවුන් මගේ ඇඳුම් සහ ඇඳ ඇතිරිලි විසි කරාවි. වටිනා ඡායාරූප දුසිම් ගණනක් විනාශ කරාවි.

පොත්, පරණ පොත් කඩේකට විකුණාවි.

ගෘහ භාණ්ඩ ඔවුන්ට වැඩක් නැති නිසා අඩු මිලකට විකුණා දමාවි, නැත්තං නිකම් දේවි.

ඉතින්, මම කැමතිම දේවල් කිහිපයක් පමණක් තෝරා ගත්තා. මම පිඟන්, සාස්පාන් කට්ටලයක්; කියවිය යුතු පොත් කිහිපයක්, තේ පෝච්චියක් පමණක් වෙන් කර ගත්තා.

මම මගේ හැඳුනුම්පත,

ජ්‍යෙෂ්ඨ පුරවැසි සහතිකය,

සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත සහ බැංකු කාඩ්පතක්

22 වන පිටුවට

# ප්‍රවීණ කිතුනු ලේඛක මොරිස් බොල්ලැගල සදා සාමය හිමිවේවා!



මෙරට ජ්‍යෙෂ්ඨතම කිතුනු ලේඛකයකු වූද, දශක දෙකක් පමණ ජාතික කතෝලික ලේඛක හවුලේ නායකත්වය දරමින් සුවිශාල මෙහෙවරක නිරතවූද, භක්ති ප්‍රබෝධනයට කලක් විවිධ නිර්මාණ සැපයූවකු වූද, ප්‍රවීණ ලේඛක මොරිස් බොල්ලැගල මහතා ඉකුත් ඉල්මහේ 14 දා සමිඳු තුරුලේ සැතපුණේය. ලේඛන කලාව පමණක් නොව, වේදිකා නාට්‍ය රචනය හා රංගනය, රූපවාහිනි පිටපත් රචනය හා රංගනය, ගුවන් විදුලි විශේෂාංග නිර්මාණය, විදිමත් දේශන ආදී විවිධ ශිල්පවලින් ජනතාව අතර ප්‍රකට නාමයක් දිනූ මොරිස් මිය යන විට අසූනව වන වියේ පසුවිය.

විවිධ සම්මාන වලින් පිදුම් ලත් මොහු නොබෝදා පැවති භක්ති ප්‍රබෝධනය 125 වන සංවත්සර උළෙලේදී ද සම්මානයට පාත්‍රවිය.

**කැලිස්ටස් ජයමාන්න**

*මොරිස් බොල්ලැගලයන්ගේ සුවිශාල සේවය අගය කරමින්*
*ඔහුට දෙව්මව් තුරුලේ සදා ආනන්දය අත්වේවායි*
*සංස්කාරක පියතුමා, කාර්ය මණ්ඩලය හා ලේඛක පාඨක හැමගේ ප්‍රාර්ථනයයි.*

---

# මොකටද භේද ඇණේ දුවන්නෙ එකම හුස්ම නම් ...

මොනවද මේ ආගම් කියන්නේ?
මම කතෝලික, ඔයා බෞද්ධ,
මෙයා ඉස්ලාම්, අරයා හින්දු,
කිය කිය භේද වෙන එකද ?
ඔය හැම ආගමක්ම මොනවද උගන්වන්නේ?
වෛරය, ඊර්ෂ්‍යාව, පලිගැනීම, මේවද?
නෑ...නෑ...නෑ...,
ආදරය, බෙදාගැනීම, එකමුතු කම..., මේවා නේද?
කෙටියෙන්ම ඒවා උගන්වන්නේ මනුස්සකම නෙමේද?
අපි හරියට ආගම අදහනවනම්,
අපේ ක්‍රියාවලින් ඒක පේන්න ඕන නේද?
එහෙම නැත්නම්,
සමාජයේ මනුස්සකම නැත්නම්,
ආගම් පමණක් ඇදහීමේ අරුත කුමක්ද?
අනිත් කෙනාට හරි යද්දි,
පෞද්ගලිකව මට කටුවෙන් අනිනව වගේනම්,
මං ආගම අදහන එකේ තේරුම මොකක්ද?
සමාජයේ නීති, මං ඉන්න තැන නීති,
හැම එකක්ම අකුරටම රැක්කත්,
මං ගාව මනුස්සකම නැත්නම්,
එතන අරුතක් තියෙනවද"
ලෝකයම දින්නත් අමනුස්සකමින්,
පලක් තියෙනවද?
මනුස්සයා නීතියටද? , නීතිය මනුස්සයාටද?
මගෙ හිතේ නම්,
නීතිය මනුස්සයාට කියලයි
ජේසු සමිඳු කිව්වේ ...

**කීර්ති සඳරුවන් ප්‍රනාන්දු**
දිව්‍ය හෘදයේ දෙව්සත්හල (නි.ම.නි.),
"සිදුපියනිල", බණ්ඩාරවෙල.

# වෙඩි බෙහෙත් අහිංසකයි.... දරුණුයි අපේ ආගම් ....

ජිනදාස කොල්ලො උඹ සිංහලේ ගියාද?
ජේසුදාස අනේ ඔයා දැන් දාසයෙක් වෙලාද?
හසන් රාසා දෙයියනේ ඔයා ජිහාඩ් කඩුව
හලාල් කෙරුවද?
ලා...ලලාලා... ලා... ලලාලා... ඔයාට දැන්
සනීපද?
ගිනිගත්ත දෙව්මැඳුරේ රතු ලේ විලක් මැද
පොඩි දුවක් වැටිලා හිටියා ඇස් දෙක පියාන
පුපුරවන්න ලොවෙත් බැරි එක ප්‍රේමය නම්
ආගම ඔයාලා දැක්කද පොඩි එකාගෙ කිරි දත්
සෙට් එක
පිරිත් පැන් බීලයි සුදු මකරු ගිනි පිඹින්නේ
කුරුස දලු දාලයි බයිබලේ ටිකෙන් ටික
වැහෙන්නේ
අබායාවක් මැද හඳපළුවකි මැදෙන්නේ
කව්ද හත් දෙයියනේ ස්වර්ගයට යන හරි පාර
කියන්නේ
රාසා රාසා මැරෙනවනම් අපි මැරෙමු මචං
පුපුරං
වෙඩි නූල ගෙනත් මගෙත් පපුවේ හරි මැද ම
බැඳපං
පුපුරනා දේ අපේ ලෝකෙට මචපු කෙනා
හොයපං
වෙඩි බෙහෙත් අහිංසකයි දරුණුයි අපේ
ආගම්
රෝස නිම්නය පෙනී පෙනී
සමනලයන්ට වෙඩි වදී
පැදි දිය මත පා වෙවී
ස්වර්ගෙට යයි මළ මිනී
අල්ලාහ් නැවත එන්න - ජේසුනී නැවත
එන්න
මිනිසුන්ට කියලා දෙන්න - ප්‍රේමය නම් ආගම

**ගායනය සහ සංගීතය : සාදර බණ්ඩාර**
**පද රචනය : ටිමරාන් කීර්ති**

ප්‍රේමය වූකලි සෑම ආගමකටම අයත් පොදු ධර්මතාවකි.

ගම් පෙරළියේ ජිනදාස සිංහලේ යන්නේ දියුණු වෙන්න. අපේ මිනිස්සු සිංහලේ කියලා මේ රට අපේ විතරයි කියන මානසිකත්වයට එනවා. අපි හැමෝම ස්වදේශිකයෝ. කිසිම ආගමක ශාස්තෘවරයෙක් අපට රට බෙදා ගනිල්ලා. පල්ලි - පන්සල් හදපල්ලා, අපේ ආගම විතරයි තියෙන්නේ ඕනේ අනික් ආගමිකයන් මරපල්ලා කිව්වේ නෑ.

'ජේසු දාස ඔයා දාසයෙක් වෙලාද?'

අපි ඇත්තටම පල්ලි - පන්සල්වල දාසයෝ වෙලා. ඒවා වලින් කියන දර්ශනය අනුගමනය කරනවා වෙනුවට අපි සංස්කෘතියක් අනුගමනය කරනවා. අපි පන්සල් යන්නේ අපල දුරු වෙන්න කියලා බාර ගැට ගහන්නයි... දානෙ දෙන්නයි... පල්ලි ගියේ නැත්තං කනත්ත හම්බවෙන්නේ නෑ. එහෙනම් ආගමේ රඳවා ගන්නේ බලහත්කාරයෙනුයි.

'හසන් රසා ජිහාඩ් කඩුව හලාල් කෙරුවාද?'

මේ ප්‍රශ්න කරන්නේ ඉස්ලාමීය ඉගැන්වීම් නොව නමුත් දෙවියන්ම මැවූ මිනිසා මරන්න දෙවියන්ගේම අවසර ගත්තාද කියලයි. වෙනත් ආගමක් ඇදහූව නිසා අල්ලාහ් දෙවියන් අවසර දේවිද මිනිසුන් මරන්න...?

ජාතිවාදය අවුස්සලා බෝම්බ පිපිරී ගියාම උඹලට සනීපයිද?

ලේ විලක් වන පල්ලිය මැද පොඩි දුවක් හිටියාලු ඇස් දෙක පියාගෙන. මේ ළමයා දන්නේ නෑ ආගම් වාදය, ජාතිවාදය, වර්ගවාදය... එහෙම අහිංසක නොදරු පරම්පරාවක් තමයි මේකට බිලි වෙන්නේ. අපේ වැරදි හා දරුණුකම් නිසා විඳවන්නේ ඒ අහිංසකයෝයි. බලන්න උන්ගේ කිරි දත් වැටිලාවත් නැති හැටි තවම... අපි හැමෝම

හැමෝටම ප්‍රේම කරා නම් කාටවත් පුළුවන්ද ඒ ප්‍රේමය පුපුරවන්න...?

රටට වින කරන ව්‍යවස්ථාවලට, ගිවිසුම් වලට, ප්‍රතිපත්තිවලට අත්සන් දාන්නේ, අත උත්සන්නේ කට්ටිය සුදු ඇඳගෙන... ඒ කරන්න මත්තෙන් පන්සලට, පල්ලියට ගිහින් නූල් බැඳගෙන, ආශීර්වාද අරගෙන යන ඔවුන් තමයි ගිනි පිඹින සුදු මකරු.

'කුරුස දලු දාලයි බයිබලයේ ටිකෙන් ටික වැහෙන්නේ '

ඉතා කාලීන කියමනක්. ධර්මය අනුමනය කරනවාද කියලා අපෙන්ම ප්‍රශ්න කරන්න ආරාධනයක්. හන්දිගානේ පිළිම කුරුස ස්ථාපිත කරනවා වෙනුවට ඒ ආගම්වල දර්ශනය අනුගමනය කරන්න පොත්ත අයින් කරලා මදය ගන්න කෙරෙන ඇරයුමක්.

'අබායාවක් මැද හොඳ පළුවකි මැදෙන්නේ'

මෑතක් වෙනකල් මුස්ලිම් සමාජය කාන්තාව පාවිච්චි කළේ ලිංගික උපකරණයක් ලෙසයි. රචකයා හඳ පළුවත්, ලිංගිකත්වයක් ගේනවා එක තැනකට. ලෝකයේ තියෙන්නේ පුළුවන් එක පොදු ධර්මතාවයි. එසේ නම් කවුද හරියටම ඇත්ත කියන්නේ මිනිස්සු විදිහට ආගම් අතර අපි අසරණයි. අපි හැමෝම ආගමක් අදහලා ස්වර්ගයේදී හමුවනවා නම් මොකටද මේ ගහ මරා ගන්නේ...

රාසා ඇයි නුඹ තනියම මැරෙන්නේ? මිනිස්සු වෙනුවෙන් නම්, හරි දෙයක් වෙනුවෙන් නම් මමත් එනවා උඹත් එක්ක මැරෙන්න. හැබැයි පුපුර වන දේ අපේ ලෝකෙට මවපු කෙනා හොයපං... මොකද වෙඩි බෙහෙත් අහිංසකයි, දරුණුයි අපේ ආගම්. ආගමික සංස්ථා තර්ක කරන්න බැරි ලෙස වෙඩි බෙහෙත් පත් කර ඇත. ඇත්තෙන්ම වෙඩි බෙහෙත් අහිංසකයි මොකද වෙඩි බෙහෙත් පිපිරෙන්නේ මිනිස්සු මරන්නද නැත්නම් උත්සවයක් වෙනුවෙන්ද යන්න එය නොදන්නා නිසාය.

අපි හැමෝම උත්සාහ කරන්නේ මේ ලෝකය ලස්සණ තැනක් කරන්නයි. (රෝස නිම්නය පෙනී පෙනී) අනාගත පරපුරට වෙඩි තියනවා (සමනලයන්ට) අපි ස්වර්ගයට යවන්නේ මළ මිනී.

ආගමික ශාස්තෘවරු කියා දුන් දර්ශනය නැවත වරක් කියාදෙන්න ඔවුන්ට හඬ ගසන්නට සිදුවීම කෙතරම් අභාග්‍යයක් ද... ටිම්රාන් කීර්ති හා සදාර බණ්ඩාරගෙන් මේ නිර්මාණය ජීවිතය හා ප්‍රේමයේ ආගම ගැන කියා දෙන අපූරුව නිර්මාණයකි.

**තීක්ෂණ පෙරේරා**
ශ්‍රී හෘදයේ ආධුනිකරාමය, බණ්ඩාරවෙල.

# භක්ති ප්‍රබෝධනයම කවි


ප්‍රබෝධනයම ඔපවත් කළ ෆාදර්ට ත් තුති
කවි නිසඳැස් රචනා ලියූ ඔබ සැමටත් තුති
විනිසුරු මාලා පැළඳූ දෙවිඳුන් ටත් තුති
අනුග්‍රහය දුන් පාඨක ඔබ සැමටත් තුති

පස්කල් ජයමාන්නයනි ඔබ හට මේ එවන්නේ
කවියට සාධාරණයකි ඔබ තුමගෙන් පිදෙන්නේ
අනුප්‍රාස එළිවැට විරිතුත් යොදලා තිබෙන්නේ
ශබ්ද රසය නම් මනාව යොදා ඇතැයි සිතෙන්නේ

ගැඹුරු වුණත් වචන පෙළේ සරල බවක් ඇත්තේ
සරල වුණත් අත්දැකුමන් බර ඇති ඔය පැත්තේ
ආදරයයි කඳුළයි පැළ වී ඇත සිත් වත්තේ
කවියනි නොතබන්නෙමි අදනම් මුරුංගා අත්තේ

**ප්‍රියංග ජයසූරිය,**
චර්ච් විව්, කැපුන්ගොඩ

# සත්‍ය සිදුවීමක් ඇසුරිනි....



අලුත් පොත්ටික තුරුලු කරගෙන
ප්ලාස්ටික් මල්ලේ ගෙනා
හිටියේ මම ආඩම්බරෙන් හරි....
සුවඳ බලමින් ඉඹ ඉඹා....
කාටදෝ පින් සිදුවුණාවේ
පුංචි අකුරින් යට ලියා............
කොළඹ නෝනෙක් පන්සලේ දී
අලුත් පොත් ටික මගේ කළා.......
අලුත් සුවඳට මමත් ආසයි
පොතෙන් මකනෙන් ආ හඹා.......
පැන්සලත් අලුතෙන් ගෙනාවට ...
අකුරු නම් මට නොලියවුණා......
මැටි මෝල ලෙස පහේදිත් මම
හිටියේ විරුදය ලබා.......
ඒත් අලුතෙන් හයට ආවේ
වෙනවාමයි මිනිහෙක් හිතා........
අලුත් වසරේ අලුත් පන්තියේ
අලුත් පාඩම ඇරඹුණා.
අලුත් ටීචර් හිනා නැතුවට
බටර් පාටින් බැබැලුණා......
මුල් ම පාඩම "පවුල " නම් විය....
එකින් එක පැහැදිලි කළා...
පාඩමේ නම මමත් ඇන්දා ....
"පවුල "කියලා ඉරි ගසා.........
තම තමන්ගේ පවුලේ රූපය
අලවලා ගෙන එන ලෙසින්
ටීචර් පැවරුවා නොවැරදී එය
හෙට කරන් පැමිණෙන ලෙසින්..........
ගෙදර විත් දහ අතේ හෙව්වා
අවුස්සා ගෙයි පෙට්ටගම්
අත්තම්මේ මට අනේ කියහන්
මගේ පවුලත් කෝ ඉතිං
මං වඩාගෙන අම්මා ඉන්නා
එකම එක පින්තූරයක්
කොහේ හරි හංගා තියේ නම්
අත්තම්මේ මට එය දියන්
ඇසුවාට කට කැඩෙනකන් මං
අත්තම්මා බීරිව ගිහින්
මක් කරන්නද පවුලේ රූපය
හිතෙන් මැව්වා මම හොරෙන්...
රෑට ගෙන ආ පාන් බාගේ
ඔතා තිබූ පත්තර කොළෙන්
වාසනාවට හම්බුණා මට
තිබී පවුලක රූපයක්.....
ඉංගිරිසි පෙනුමක් වුණේ එහි....
තාත්තා ඇද ටයි කෝට්
මම වගේ කොලුවෙකුත් උන්නා
හම සුදුයි උෟ ඉස්තරම්
එය කපා ගෙන පොතේ අලවා
මම උජාරුව ගිය හිතින්
උදෙන් මම පාසලට ආවේ....
හොඳයි ගන්නයි ටිචර් ගෙන්...
පේළියට පොත් බලා ආ ඇය
මගේ පොත ළඟ නැවතුණා..
"මේ මොකක් ද" යි?
ඇසූ ඇගේ ඇස්
ගිනි බෝල වී උඩ ගියා....
මගේ සුදු පවුලත් කපාගෙන
රතු පෑන දුවගෙන ගියා
ඒක විතරක් නම් මදෑ මගේ
අලුත් පොත් ඉගිලී ගියා.....
කනෙන් අල්ලා තදින් මිරිකා
පිස්සු දැයි මට ඔරවලා
අහද්දී නම් අනේ ටිචර්
හිත කීරිගැහිලා ගියා .
අහුල ගෙන මගේ විසි කළ පොත
ඉරා පවුලේ රූපේ මං
කටේ දාගෙන හපලා කෑවේ
ඇයිද දන්නෑ ටීචර් මං
(දරුවා යනු මිටි කළ වැඩිහිටියෙක්
නොවේ..ඔහුට සංවේදී වෙමු....)

මුදිතා චන්දිමා දසනායක

# දයා සිතැත්තෝ ( කෙටි කතාව )

"මිලා නංගියෙ මොකද පරක්කු වුණේ"?

"අනේ ඇලිසක්කෙ, දුවගෙ ඉස්කෝලෙට අඳින සුදු ගවුම ඉරුණනෙ. ඒක මැහුව".

"අනේ මිලෝ ඉස්කෝලෙ ගිහිං කාටද හරි ගියේ ? අපේ කෙලී අට පාස් උණා විතරයි මම නවත්ත ගත්ත. අපිට හම්බ කරන්නයි ගෙදර වියදම් කරන්නයි බැහැනෙ. දැන් ඔන්න පැටව් තුන් දෙනෙකුත් හදාගෙන ගෙදර ඉන්නව".

"අනේ මාග්‍රට් අක්කේ, අපේ දුව හොඳට ඉගෙන ගන්නව කියල ගුරුවරු කියන්නෙ දිගටම උගන්වන්නයි කියල".

"දිගටම උගන්නල මහ ඒජන්ත කෙනෙක් කරන්නද ? ගුරුවරු නම් කියයි. අපි එපැයි වියදම් කරන්න".

"ඒකනම් එහෙම තමා මාග්‍රට් අක්කෙ. ඒත් ඉතින් අපි මේ විඳින දුක උන්ටත් උරුම කරන්න බැරි නිසා තමයි මම උගන්නන්න මහන්සි වෙන්නෙ" .

"හොඳා හොඳා තමුංගෙ මට්ටං තම්මට්ටං කියනවනෙ. ඔය කෙලී කොල්ලෙක් එක්ක ගිය දාට මිලෝ උඹ ට තේරෙයි".

"අන්න අන්න මාළු ඔරු එනව. යමල්ල යමල්ල දැල් ටික ගොඩට අදින්න උදවු වෙන්න".

"මිලා නංගියෙ ඔය මාග්‍රට් කියන ඒව ගණන් ගන්න එපා. උඹ දරුවට අකුරු සාස්තරේ හොඳට උගන්නහං. මේ අපි දුක්විඳින්නෙ මොකද? අපේ කරුමෙ බං කරුමෙ".

"ඔව් ඇලිසක්කෙ මම ඕව ගණන් ගන්නෙ නැහැ. ඒත් මට හරි කේන්තියි. මාග්‍රට් අක්ක හැමදාම මගේ කෙලී ගැන ඔය විදිහට තමයි කථා කරන්නෙ".

"ඊරිසියාව බං ඊරිසියාව".

වෙරළට එකතුවූ මාළු වෙළෙන්දියෝ වහ වහා ඔරු ගොඩට ඇදීමට උදවු වූහ. මුහුදු ගිය මාළු ඔරුවලින් මාළු රැගෙන වෙළඳාමේ යෑම ඔවුන්ගේ දෛනික රජකාරිය විය.

මිලා තම දියණිය වන මරීනා සමඟ ජීවත් වෙයි. ඇගේ සැමියා දිනක් මුහුදු රස්සාවට ගොස් නැවත පැමිණියේ නැත. මරීනා ඉගෙනුමට දක්ෂය. එනිසා මිලා දුක් මහන්සි වී ඇයට උගන්වයි. එසේම දියණියව ආරක්ෂා කර ගැනීමටද කැපවී ඇත. එනිසා ඇයගේ මාළු වෙළඳාම දහවල් දෙක පමණ වන විට ඇය අවසාන කරයි. ඉන් පසුව පාසැලෙන් දියණියවද රැගෙන නිවසට එයි. හවස් වරුව දියණිය සමඟ නිවසේ ගතකරයි. ඒ කාලයේදී ඇය ගෙවත්තේ එළවළු පලා වර්ග වවයි. ඒව ඔවුන්ගේ අමතර ආදායම් මාර්ගයයි.

මිලා දියණිය කැටුව යාමට පාසැල අසලට සැම දිනකම යයි. දැරිය ටිකෙන් ටික උස් මහත් වෙද්දී එහෙන් මෙහෙන් ඇයට සමච්චල් කථා ඇසෙන්නට විය.

"මාළු මාළු දැන් ගෙනාපු මාළු. මාළු මාළු ගන්නේ කවුද මාළු. අපෝ අපෝ කුණු මාළු ගඳක් එනව". වැනි කවට වදන් අපහාස උපහාස වදන් විටින් විට ඇසෙයි. ඒ ගැන මව බොහෝ සේ කනගාටු වෙයි. එහෙත් මරීනා වචනයකුදු ඒ ගැන අම්මා සමඟ නොකියයි.

"පුතේ, ඔයාට ලැජ්ජද මම මාළු වට්ටියත් අරගෙන ඉස්කෝලෙ ළඟට එනවට ? "ඇයි අම්ම එහෙම අහන්නේ" ? "ඔයාට ළමයි එක එක ඒව කියනව මට ඇහෙනවනෙ පුතේ". " කමක් නැහැ අම්මේ, ඉස්කෝලෙදිත් ළමයි ඔයිට වැඩිය ඒව කියල මට විහිළු කරනව. සමහරු මගේ ළඟින් ඉඳගන්නෙවත් නැහැ. මට ඉතිං හරිම කේන්තියි. ඒත් මම රංඩු කරගන්නෙ නැහැ අම්මෙ. මම මොකුත් කියන්නෙත් නැහැ. මට නෙවේ වගේ ඉන්නව. එයාලටම ඇතිවෙලා නිකං ඉන්නව". "අනේ පුතේ මට හරි දුකයි ඔයා ගැන. මොනව කරන්නද මට මේ මාළු රස්සාව නවත්තන්න බැහැනෙ. ඔයා කේන්ති ගන්න එපා. පුතා ඉවසල ඉන්නකො". "කමක් නැහැ අම්මෙ. අම්මගෙ මාළු රස්සාවෙන්නෙ අපි ජීවත් වෙන්නෙ. මම හොඳට ඉගෙන ගන්නම්කො. ඊට පස්සෙ, හොඳ රස්සාවක් කරන්නම්කො. එතකොට අම්මට මාළු විකුණන්න යන්න ඕනෙ නැහැනෙ. හැමෝටම පේන්න මම හොඳට ඉගෙන ගන්නව අම්මෙ". "අනේ මගෙ දරුවෝ;

ඔයා හිතන දේවල්. ඔයා හොඳට ඉගෙන ගන්නකො. ඉස්කෝලෙ ගුරුවරුත් ඔයාට විහිළු කරනවද?" "අනේ නැහැ අම්මෙ, අපේ ගුරුවරු මට හරි ආදරෙයි. අපේ ගණිත් ටිචර් තමයි ගොඩක් ආදරේ". "ඒ මොකද ? "

"මට තමයි ගණිත්වලට ලකුණු වැඩිම. මං ඉතිං අම්මෙ, අම්මගෙ ගණිත්කාරිනෙ".

"අනේ දරුවෝ ඔය ළමයි විහිළු කෙරුවට එයාලගෙ ගෙවල්වල හැමෝම වගේ මගෙන් තමයි මාළු ගන්නෙ. එයාල දන්නව මම පරණ මාළු ගෙන්නෙ නැහැ කියල. මගෙ පුතා ඕවා ගණන් ගන්න එපා". "ඒ උනාට අම්මෙ අර වත්තෙ ලොකු බංගලාවෙ අය මාළු ගන්නෙ නැහැ නේද" ? " අපෝ නැහැ. එයාල, මාළු ගන්නව තියා ගේට්ටුවවත් අරින්නෙ නැහැ". " රෝෂිනී කියන ළමය තමයි ඒ ගෙදර ඉන්නෙ. එයා නම් මා එක්ක හරි තරහයි". "ඇයි පුතේ ඒ"? "එයාට ගණිත්වලට ලකුණු අඩුයි. අනිත් වැඩවලටත් ඉතිං ලකුණු අඩුයි. ගණිත්වලට ගොඩක් අඩුයි". "ඉතිං පුතේ ඔයා උදවු කරන්නකෝ". "අපෝ අම්ම හරි කථාවක් තමා කියන්නෙ. එයාට ගණන් කියා දෙනව තියා මා ළඟටවත් එන්නෙ නැහැ. බැරි වෙලාවත් ළඟට ආවොත්, අපෝ කුණු මාළු අපි ළඟට එන්න එපා කියනව. මාත් එක්ක කථා කරන අයට මම උදවු කරනව". "ඉතිං රෝෂිනී කියන ළමය ඔයා එක්ක කථා කරන්නෙම නැද්ද" ? "නෑ අම්මෙ නෑ. මේ පොඩි දුරත් එයා එන්නෙ යන්නෙ වාහන වලින්මයි. එයාලට වාහන තුන හතරක්ම තියෙනව." "එයාල මොනව කිව්වත් ඔයා ගණන් ගන්න එපා. ඔයාගෙ ඇඟේ වදින්නෙ නැහැනෙ. එයාල ලොකු මිනිස්සු. අපි ඉතිං පුංචි මිනිස්සුනෙ පුතේ". "මම ගණන් ගන්නෙ නැහැ අම්මෙ. ඒත් ඉතිං සමහර වෙලාවට මට කේන්ති යනව. එතකොට ඉතිං මොනව හරි කියනව". "රංඩු කරන්න නම් එපා පුතේ. ඔයා මහන්සි වෙලා ඉගෙන ගන්නකො. එතකොට හරි යයි".

මෙසේ කාලය ගතවිය. දිනක් අම්මාත් දුවත් පාසැල නිමවී යන අතර "අම්මෙ අර අර යන්නෙ රෝෂිනී තමයි. එයා අද පයින් යනව මොකද දන්නෙ නැහැ". "අනේ පුතේ අහල බලන්නකො". "අනේ අම්මෙ මට බැහැ, එයාගෙ ආඩම්බර බලන්න". "පුතේ මොනව හරි කරදරයක්ද දන්නෙත් නැහැනෙ. අහල බලන්නකො". "හා එහෙනම්"! කියා ඇය අකමැත්තෙන් දිව ගොස් "රෝෂිනී, ඇයි ඔයා පයින් යන්නෙ" වාහනයක් ආවෙ නැද්ද?" යැයි ඇසුවාය. ඇය හිස හරවා නොරුස්සනා බැල්මකින් බලා හිස ගස්සා ඉවත බලා ගමන ඉක්මන් කළාය. මරීනා ආපසු අම්මා ළඟට දුවගෙන ඇවිත් "ඒකනෙ අම්මෙ මම කිව්වේ එයා හරිම ආඩම්බරයි කියල". "කමක් නැහැ පුතේ අපේ යුතුකම අපි කළානෙ" යැයි කියනවාත් සමගම වේගයෙන් පැමිණි මොටර් සයිකලයක් ඔවුන් පසුකරගෙන ගියේය. සැණකින් විශාල ශබ්දයක් සමග කවුරුන් හෝ කෑ ගසන හඬක් ඇසිණි. මවත් දුවත් ඉදිරියට දුවගෙන ගියේය.

"අම්මෙ අම්මෙ අර රෝෂිනී නේද වැටිල ඉන්නෙ. අර බයිසිකලේ හැප්පිලා. අන්න බයිසිකල් කාරය ආපහු නැගල යනව. අම්මෙ දුවමු දුවමු රෝෂිනීට මොකද දන්නෙ නැහැ. ඔවුන් එතනට යනවිට රෝෂිනී බිම වැටී හඬමින් කෑගසයි. කකුලෙන් ලේ ගලාගෙන යයි. අම්මා නැමී ඇයව නැගිටවීමට තැත්කළත් ඇයගේ කකුල එසවීමට නොහැකි විය. "පුතා පොත් ටික අහුලගෙන මගේ මාළු වට්ටියත් අරගෙන එන්න. මම මේ දරුවව ගෙනියන්නම්" කියා රෝෂිනීව දෑතට ඔසවා ගත්තාය. බොහෝ අමාරුවෙන් වහ වහා රෝෂිනීගේ නිවස දෙසට ගියාය. මරීනා රෝෂිනීගේ සහ තමාගේ පොත් පත්ද අම්මාගේ වට්ටියද රැගෙන දුවගෙන ගියාය. එවිට අම්මා රෝෂිනීගේ ගෙදර ගේට්ටුව ළඟය. "ගෙදර කවුද? ගෙදර කවුද ? කවුරු හරි එන්න" යනුවෙන් කෑ ගසයි. ගේට්ටුවේ සවිකර ඇති සීනුවේ ස්විච්ය දුටු මරීනා එය නාද කළාය. දිගටම නාද කළාය. එසැණින් කාන්තාවක් දුවගෙන ආවාය. "අනේ මොකද මේ මොකද උනේ? රෝෂිනී දුව නේද මේ" ? "මේ දුව එනකොට බයිසිකලයක් හප්පාගෙන ගිහිල්ල. බයිසිකලේ නවත්වන්නෙ නැතුවම ගියා". "අනේ මේ ලේ ගලනව. දොස්තර කෙනෙක් ළඟට යන්න වාහනයක් වත් නෑ. අද ගෙදර කවුරුත් නැහැ. අනේ දෙවියනේ මම මොකද කරන්නෙ" යැයි විලාප දෙද්දී "නෝන කථා කර කර ඉන්න වෙලාවක් නැහැ. මේ දරුවව ගන්න. මම දුවල ගිහිං ත්‍රීවීල් එකක් වත් ගේන්නම්. නෝන අයිස් ටිකක් වත් තියල ලේ නවත්තන්න බලන්න.

මද්දහන වෙලාව හන්ද ලේ ගලනව වැඩියි. මගේ දුව මෙහෙ ඉන්න මං ඉක්මනට එන්නම්" කියමින් මිලා දිව යන්නට විය. සැණෙකින් එතැනින් යාමට පැමිණි වාහනයක් නවතා ගත් ඕ ආපසු ආවාය. "එන්න එන්න නෝන මේ වාහනේට දරුවත් අරගෙන එන්න."

වහ වහා රෝෂිනීව වාහනයට නංවා රෝෂිනීගේ මවත් නැග්ගාය. "නෝන පරිස්සමින් යන්න අපි යන්නම්". "අනේ පොඩ්ඩක් මාත් එක්ක යන්න එන්න පුළුවනිද " මේ දුවට අපේ ගෙදරින් ඉන්න කියන්න. දුව ඔයා අපේ ගේ ඇතුළට යන්න. වැඩ කරන කෙනා ඉන්නව බයවෙන්න එපා". "පුතා පරිස්සමින් ඉන්නකො මම ඉක්මනට එන්නම්" කියා මිලා ද වාහනයට නැගුණාය. මරීනා වට පිට බලමින් ගෙතුළට ගියාය. සාලයේ වූ පුටුවක හිඳ ගත්තාය. ඒ විසල් සාලය දෙස විස්මයෙන් බැලුවාය. එහි ඇති බඩුමුට්ටු දෙස දෑස් දල්වා බැලුවාය. කිසි දවසක නුදුටු බඩු භාණ්ඩ දෙස බැලුවාය එවිටම ගෙතුළින් කාන්තාවක් පැමිණියාය. "කවුද මේ දුව" ඇයි මොකද"? "නැන්දෙ මෙහෙ රෝෂිනීව වාහනයක හැපුණා. එයාගෙ අම්මයි අපේ අම්මයි එයාව මේ ළඟ තියෙන නර්සිං හෝම් එකට ගෙනිච්චා. අපේ අම්ම එනකං මට මෙහෙ ඉන්න කිව්ව". "අනේ අපේ බේබිට ගොඩාක් තුවාලද" අපි දන්නෙවත් නැහැනෙ. අයියෝ! අද එක වාහනයක් වත් නැහැනෙ. රෝෂි බේබි අද ඉස්කෝලෙට පයින් ගිහිං පයින් එනව කිව්වේ".

"ඔව් ඒ එනකොට තමයි මෝටර් සයිකලේක හැපුණෙ". "දුව කෑම කාලද"? " එපා එපා මට කන්න බැහැ දැං" "ඉන්න මම බොන්න මොනව හරි ගේන්නම්" කියා ඇය නිවස තුළට ගියාය. මඳ වේලාවකින් කේක් කෑල්ලක් සමඟ කිරි කෝප්පයක් ගෙනාවාය. මරීනා ඒ සංග්‍රහය භුක්ති වින්දාය. ඊට ටික වේලාවකට පසුව අම්මා ඒ වාහනයේම ආපසු ආවාය. මරීනා ඉදිරියට දුවගෙන ගියාය.

"අම්මෙ රෝෂිනීට මොකද"? "කකුලෙ ඇටේ පුපුරල වෙන්න ඇතිලු. එයාව නවත්ත ගත්ත. හැම තැනම පොඩි පොඩි තුවාල. කකුලෙ තුවාලෙ තමයි ලොකු. එයාගෙ අම්මත් නැවතුණා. එතැනට ඒ ළමයගෙ තාත්තත් ආවා. ඉතිං මං ආවා". "රෝෂිනී කථා කළාද අම්මෙ"? "ඔව් ඔව් අඬනව අඬ අඬා කථා කළා. මාව අත ගගා ඇඬුව". "අම්මෙ වාහනේට සල්ලි" ? "සල්ලි නම් මොනවද පුතේ" ඔය වෙලාවෙ එයාලට සල්ලි මතක් වෙනවද " මාළඟ අද මාළුවල සල්ලි තියෙනවනෙ. පොඩි ගානයි වාහනේට ගත්තෙ. අපි යමු දුවේ ගෙදර හොඳටම හවස් උණා. ඔයාට බඩගිනිත් ඇති නේද?" "නෑ අම්මෙ මම රස කේක් කෑල්ලක් කාල කිරි එකකුත් බිව්වා. හරි රසයි අම්මෙ. අම්ම තමයි බඩගින්නෙ ඉන්නෙ".

"මට ඉතිං ගානක් නැහැ පුතේ. යමු ඉක්මනට" කියමින් මවත් දුවත් පාරට පිවිස, වහ වහා නිවස බලා ගමන් කළෝය.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

## දිවියේ මට දුන් ...

දිවියේ මට දුන් සියලුම දේ
ලැබුණේ කාගෙන්දැයි සොයමි
දිවියේ මනහර දුටුවේ කවුරුන්දෝ
ඔබමය දෙව් සමිඳේ නිතිනේ

දිවියේ සියලුම දුක් කරදර හැම
විඳ දරා ගන්නට අප සැම හට
නිරතුරු ශක්තිය ධෛර්යය දුන්නේ
ඔබමය සමිඳේ අපහට නිතිනේ

නිරතුරු අප අතරේ රැඳෙමින්
සිනහව අතරේ සැඟවී ඉන්නේ
දෙලොවක් අතරේ තනිවුණ මා හද
ඔබමයි සමිඳේ නිති වැඩ සිටියේ

වෙහෙසී දුක් වී විඩා නිවාදෙන
සැනසුම ඔබමයි අප හැමගේ
නිරතුරු ඔබ හමුවට එන්නට
සිත් නිරතුරුවම සැරසෙන්නේ

**දිලක්ෂි ශිරන්‍යා රුදිගු**
9 ශ්‍රේණිය, සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 7.

# ඇඳෙන් වැටුණු උඹලට....

උන්ගෙ සැප ලෙෆ්ට් වෙච්ච
තැනදි උන් ලොප් වෙච්ච
ගහපු කතිරයෙ තරම
අසූවක් විශ්‍රාම
තිබුණේ නම් නෑ එහෙම
මීට පෙර අපි දැක්ක


තව්තිසා දෙව්ලොවක
සිටියාද පෙර දවස
බලෙන් රට උදුරගෙන
අපා ගත කෙරුවාද
හිටිය හැටි මතක නෑ
උන්ගෙ හුරතල්ලූන්ට

බිත්තරය පොල් ගෙඩිය
නෙවෙයි රටෙ උත්තරය
ගොම්මපිල හිටි ගමන්
ඇඳෙන් වැටුණාවත්ද..?



චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# DO WE REALLY NEED A RELIGION?

**Fragility of Human Nature….**

From time immemorial, there has been a deep-seated ever disturbing feeling in many human beings caused by their fragile limits. Such people thus strongly believed that they could overcome any challenging situation only thanks to certain deities, whose overwhelming stronghold and ensuring protection encompass all possible boundaries. This is clearly evident when observing their attribution of divinity to the Sun, Moon or even Stars for human safety and protection.

Ever since then, thus religion has been a cornerstone of human life, shaping societies, values, and personal identities. For some, it is a profound path to purpose and spiritual connection, while for others, the journey to meaning unfolds outside traditional religious structures. Whether through Catholicism or other religious frameworks, or through secular beliefs, both paths influence how people understand purpose, morality, and community.

**Does a man really need a religion?**

At its essence, religion provides answers to life's biggest questions such as "Why are we here? "and "What is the meaning of life?" For Catholics, these questions are answered through faith in God and the teachings of Jesus Christ, which promote a life centered on love, compassion, and humility. Therefore, religion's ethical teachings offer guidance on how to live, shaping character and steering believers toward empathy, forgiveness, and kindness. The Catholic Church, for instance, emphasizes serving others and charitable work, which has positively impacted millions worldwide. For those who follow a religion, it offers not only personal growth but also a solid foundation for family life and social responsibility.

In addition, religion also fulfills a deep need for an inspiring community. For example, places of worship, like our Catholic parishes, have become centers for worship, fellowship, and support, uniting people across backgrounds and ages. In this shared space, individuals find great strength, comfort, and belonging, which can be vital for mental and emotional health. Transcending limitations, faith communities often become extended families that celebrate joys together and provide solace during hardships. These benefits have a lasting influence, helping people to confront life's struggles with resilience, knowing they have a spiritual home.

More importantly for many, religion is a profound source of hope and comfort in times of suffering, loss, or uncertainty. Belief in God or a higher purpose can offer peace and assurance, especially in challenging times. The Catholic faith, for instance, reassures believers that they are part of a divine plan, helping them find meaning even in pain.

**Are non-believers sinners?**

However, some choose a path outside organized religions. In today's secular age, some feel that religion may not address modern questions or values effectively. For example, the Catholic Church's traditional teachings sometimes feel at odds with progressive societal norms, creating tension for those seeking more contemporary viewpoints.

Others see certain interpretations or misuses of religious principles as divisive, which can lead to misunderstandings about the role of faith in modern life. For people who are not religious, alternate ways of finding purpose and morality exist. Many embrace secular humanism, a philosophy that values compassion, reason, and ethical behavior without reliance on religious doctrine. Ethical principles such as kindness, fairness, and respect can be derived from empathy, social responsibility, and shared cultural values, showing that morality is not exclusive to religious teachings.

Non-religious individuals also find community, often through friendships, family, or interest-based groups. Some volunteer in charities, join advocacy groups, or support causes that align with their values, finding belonging and purpose in shared efforts to make the world a better place. Many such people turn to practices like meditation, mindfulness, or creative expression for emotional resilience, gaining peace and strength without religious beliefs.

Is following a religion better than not....?

Overall religious and non-religious lives offer paths to fulfillment, kindness, and connectedness. Therefore religion provides a structured, tradition-rich approach that helps many individuals live meaningful lives. On the other hand, those outside religious frameworks often craft a personalized path to purpose, finding inspiration in human connections, nature, or the pursuit of knowledge.

In conclusion, in a world where faith and secular beliefs coexist, both approaches offer unique contributions to society. Ultimately, whether through the teachings of Catholicism, another religion, or a secular philosophy, individuals are continually drawn to seek meaning, live morally, and contribute to a compassionate world.

**Udugampolage Gihan Fernando**
Director, Institute of British Examinations
Negombo.

**ප්‍රසිද්ධිය සහ ධනය සඳහා තරඟ කිරීම ....**
12 වන පිටුවෙන්.....

පමණක් ගත්තා. මේ ඇති! මගේ අසල්වාසීන්ගෙන් සමුගෙන, මම දොර ළඟ දණින් වැටී තුන් වරක් වැඳ මේ නිවස නැවත ලෝකයට දුන්නා. ඔව්! ජීවිතයේ දී ඔබට නිදා ගත හැක්කේ එක ඇඳක පමණි, ජීවත් විය හැක්කේ එක් කාමරයක පමණි. ඊට වඩා යමක් ඇත්නම් ඒවා හුදු සුඛෝපභෝගීත්වය සඳහා පමණි! ජීවිත කාලය පුරා ජීවත් වූ පසු අපට මිනිසුන්ට අවසානයේ මෙය තේරුම් යනවාඃ ඇත්ත වශයෙන්ම බොහෝ දේ අවශ්‍ය නෑ. සතුටින් සිටීමට සිතා අනවශ්‍ය දේවලින් විලංගු දාගන්න එපා! ප්‍රසිද්ධිය සහ ධනය සඳහා තරඟ කිරීම විහිළුවකි. ජීවිතය යනු එක් ඇඳක්, ඇඳුම් කිහිපයක් සහ වරකට එක ආහාර වේලක් පමණක් නොවේද? ඔබට මේවා සිය ගණනක් තිබිය හැකිය, එහෙත් ඔබට භාවිත කළ හැක්කේ වරකට එකක් පමණි.

අවුරුදු 40/50 ට වැඩි පුද්ගලයන් වන අප අපගේ ගමනේ ඉතිරි කාලය මිහි මත ගත කරන්නේ කෙසේද යන්න ගැන ඔබ හොඳින් සිතා බැලිය යුතු නොවේද? ඇත්තට වැදගත් වන සාරධර්ම ගැන අප දරුවන්ට කියා දිය යුතු නොවේද? දිනපතා කෑමට, පැළඳීමට හෝ භාවිත කිරීමට නොහැකි දේවල් ගොඩග සන්නට එපා.

නීරෝගව, සතුටින් සිටින්න. ඔබගේ දුරකථන නාමාවලිය හරහා ගොස් ඔබගේ ඉතිරි කාලයට අගය එකතු නොකරන පුද්ගලයන් මකා දමන්න. ඒ වගේම ඔබ ආදරය කරන අය සමඟ කාලය ගත කරන්න. තව එකක් හැමෝටම වැඩිහිටි නිවාසයකට යාමට තරම් කල් ජීවත් වන්නට නොලැබිය හැකිය.

# ආදරයේ හා අධ්‍යාත්මයේ ගමන් මඟ

අප ජීවත්වන ශ්‍රී ලංකාව විවිධ ජන වර්ග ජීවත් වෙන, විවිධ වූ ආගම් අදහන ජනතාවගෙන් යුත් බහු සංස්කෘතික ජන සමාජයකි. මේ ජනතාව අතුරින් කතෝලික ආගම නැතහොත් කිතු දහම අදහන පිරිස ඉතාමත් සීමිතය. අද ලංකාවේ ආගම ඇදහීම පරම්පරා ගතව පැවත එන පුරුද්දක් මෙන්ම සිරිතක් ලෙස සිදුකරයි.

**කිතු දහම යනු**

ප්‍රේමය මුල් කරගත් දේව වචනය මත පදනම් වූ ආබ්‍රහමික, ජේසුසමිඳුන්ගේ ජීවිතය හා ඉගැන්වීම් මත පදනම් වූ ඒක දේවවාදී දහමකි.

කිතු දහම පිළිබඳව අපට දේව අනාවරණයේ (වචනයේ) ලිඛිත මූලාශ්‍රය වන කිතුනු අපගේ පූජනීය ග්‍රන්ථය වූ ශුද්ධ වූ බයිබලය හොඳින් කියවා අධ්‍යයනයේදී දැනගත හැකිය. පුරාණ ගිවිසුම අධ්‍යයනයේදී ලෝකාරම්භයේ සිටම දෙවියන් වහන්සේ මිනිසා හට දැක්වූ අසීමිත ප්‍රේමය පිළිබඳවත්, නව ගිවිසුම අධ්‍යයනයේදී නාසරෙත් හි ජේසුතුමන්ගේ ජීවිතය හා උන්වහන්සේ ඉගැන්වූ ගැලවීමේ මාර්ගය පිළිබඳවත් අපට මනා අවබෝධයක් ලැබිය හැකිය. කතෝලික ආගම අදහන කිතුනුවන් වන අප සියලු දෙනා විශ්වාස කරනුයේ ජේසුස් වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන බවය. දෙවියන්වහන්සේ තුළ මනුෂ්‍යයා හට තිබූ ඒ ඉමහත් ආදරය (ප්‍රේමය) නිසා කිතු දහම සඳහා ආදරයේ ගමන් මාර්ගය යන සංකල්පය යොදා ගැනීම වඩාත් සුදුසුය.

ප්‍රසාද ස්නාපනය ලැබූ පසුව කිතු දහම වැළඳ ගත් අප ආධ්‍යාත්මික ජීවිතය ආරම්භ කරන්නෙමු. ප්‍රසාද ස්නාපනය ලබා ආධ්‍යාත්මික ජීවිතය ඇරැඹූ කිතුනු අපගේ වගකීම් නම් කිතු දහම පිළිග ැනීම, ප්‍රකාශ කිරීම හා අනුගමනය කිරීමය. අද වන විට ක්‍රිස්තියානි නමින් ප්‍රකාශ කරන කුඩා සභා රාශියක් තිබුණද පිරිසිදු වූ, සත්‍යය වූ කිතු දහම නිවැරදි ලෙස ලොවට දෙන්නේ කතෝලික ශුද්ධ වූ සභාව වේ. ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයා වන සුදුතුම් පියා යටතේ පවතින ජනතාව මේ කතෝලික සභාව වශයෙන් හඳුන්වනු ලබයි. ක්‍රිස්තුන්වහන්සේගේ දූත කාර්යයෙන් පසුව අපොස්තුලුවරුන්ගෙන් පැවත එන එකම ශුද්ධ වූ කතෝලික සභාව මෙය වන්නේය. සෑම කිතුනුවකුම දේව වචනය තුළ නිසි මාවතක ගමන් කරවීමට, අධ්‍යාත්මය ශක්තිමත් කර ගනිමින් යාච්ඤාමය ජීවිතයක් ගත කිරීමට ජනතාවට අවශ්‍ය පසුබිම සැකසීම ශුද්ධ වූ සභා නායකයන්ගේ පරම යුතුකම හා වගකීම වේ. එනිසා කිතු දහම අධ්‍යාත්මයේ ගමන් මාර්ගය ලෙසද හැඳින්විය හැකිය.

කිතුනු අපට සැබැවින් ප්‍රේම කරන දෙවි මහෝත්තමයාණන් වන ප්‍රේමණීය පියාණන්ගේ ප්‍රේමණීය දූ දරුවන් වීමට, අධ්‍යාත්මය ශක්තිමත් කර ගනිමින් විශ්වාසයෙන් යුතුව කිතු දහම තුළ ජීවත් වෙමින් ස්වර්ග රාජ්‍ය දිනා ගැනීමේ වාසනාව සෑම කිතුනුවෙකුටම ලැබේවා !

**ජේ. එල්. සඳුනි වාසනා පීන්තු -11 ශ්‍රේණිය**
ශු. පවුලේ බාලිකා මහා විදුහල, වෙන්නප්පුව.

# සාමය ඇති කරමු

සාමය සමඟිය ඇති කරමු
ගෙදරින් සාමය පටන් ගමු
රට තුළ සාමය ඇති කරමු
සාමය ලෝකෙට රැගෙන යමු

අපි හැමෝම මිතුරු වෙමු
සාමය පුරවා සැමට දෙමු
සිත් තුළ ආදරෙ ඇති කරමු
සැමට සතුට නිති බෙදමු

සැමදා අපි එකමුතු වී සිටිමු
ආදරයෙන් අත් අල්ලා ගනිමු
මේ ලෝකය අපි හැඩ කරමු
මල් වාගේ ලෝකෙට සුවඳ දෙමු

**දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු**
5 වසර - ශා. ජෝසප් විදුහල, මරදාන.

# ආගම යනු මේයයි පෙන්වූ උත්තමයෙකි.

පස්කල් ජයමාන්න උස්වැටකෙයියාව.

හදපතුලෙන් උතුරා යන සෙනේ පිදූ සැමවෙත
හරබර සිතුවිලි අතුරා පළකරමින් පොතපත
වසර අසූනමයක් සපුරා ගතකොට දිවිපෙත
අපේ මොරිස් බොල්ලෑගල මිතුරා සමු ගෙන ඇත

ලේඛක හවුලේ ජාතික කිතුනු දිගු කලක් පුරා
කළ සේවය සභාපති පදවිය කැපවී දරා
රැගෙන ගිය හැටි සාමාජිකයන් දියුණුව කරා
අමතක නොමවෙයි ලේඛක මිතුරා දිවි ඇති තුරා

පන්හිඳ ගෙන දක්වූ සුරු විරුකම් මතකේ ඇත
යහගුණදම් පොදිව තිබූ නිරතුරු ගැටුණි නෙත
සැමටම දක්වූ හිනැහී සැමවිටම හොඳ හිත
ප්‍රවීණ ලේඛක මිතුරා ඔහු විය සැලසූ සෙත

දැහැමියාව අත රැඳි පන්හිඳ මතු කළ ලෙසටම
දිවිගත කළ උත්තමයෙකි කරන්නට බැරි සම
දෙබිඩියාව නැති ඇසුරෙන් මැවුණි හද සැනසුම
අභියෝගයකි චරිතය මෙම අද මුළු ලොවටම

රසබර තැන් පූජක හා පැවිදි ජීවිත වල
මතුකරමින් ප්‍රබෝධනය මිහිතලයේ හැඩ කළ
ප්‍රදීපයට සපයනලද ලිපි නෙත ගැටෙනා කල
මෙහෙවර ඉටුකරන පැතුම දුටිමි තිබුණ හද තුළ

සොඳුරිය ගැන ලියූ පොත තිළිණය කළ දින මගේ
ලුහු බැඳවිත් දුනි මුදලක් මා හට බලයෙන් වගේ
ආගම යනු මේයයි පෙන්වූ හැටි මතකෙට නැගේ
විරලයි දෙව්වරු බඳු උතුමන් ගතවෙන මේ යුගේ

අසනීපෙන් සිටියදි අපි ගියෙමු දැකගන්නට
මතකය ඉන් පත්වුණාද කියා කොතෙක් සතුටට
ප්‍රබෝධනය එකසිය විසිපස්වස සපුරන විට
උපහාරය ඔහුට හිමි පුද කෙරුණි පුතු හට

දෙවිඳුන් දුන් තලෙන්තුවෙන් කළ සේවය අගයමු
ආදරයෙන් පවුල් දිවිය ගෙවූ අයුරු දුටුවෙමු
නිහතමාන ගුණ ඔහු තුළවූ අමතක නොකරමු
යළි හමුවෙමු කියා ලොවේදී ළස්සණ පතනෙමු

# ... ආගම යනු ...

මිනිස් දිවිය හරි යහ මග අරගෙන යන්න
කරන කියන සියලු පවින් වැළකී ඉන්න
සොයුරු පෙමට නව අරුතක් ගෙන දෙන්න
තම ආගම ඉවහල් වන බව දැන ගන්න

තම එක පුතු දේව පියා දුන්නා ඔන්න
අඳුරු දිවිය එළිය කරන් ජීවත් වන්න
කිතුනු දහමෙ සුසුදු අරුත් වටහා ගන්න
අපි දිරිගමු ජේසු පුතා ගිය මග යන්න

පෙම් කරන්න මමම නොවේ අපි යයි සිතලා
ජේසු අපිට කියා දුන්නෙ කුරුසියෙ නැසිලා
ඒ දරුපෙම අපට දෙන්නෙ අදටත් බෙදලා
දේව අම්මා පා නමදිමු බැතියෙන් පිරිලා

විඳවන ජීවිත වෙනුවට විඳිනා දරු කැල වන්නට
තම ආගම තෝතැන්නක් වෙයි හදවතට
පවුලක් ලෙස ජීවිතයේ සතුට විඳිනට
බැඳෙමු හදෙහි ආදරයෙන් දහම විලසට

අයිරින් කොස්තා - කඳවල



# ඕං එහෙනං



## ආගම ඒකලූ ... ආගම මේකලූ ...

පල්ලිය, පන්සල, කෝවිල පිරිලා සුදු පිරුවටද ඇඳ ගත් ඇත්තෝ
නෙත් සිත් අහසට ඔසවාලා දෙවිඳුන් සොය සොයා දුවනා ඇත්තෝ
සත් දින සත් දෙන ගමේ මිරිස් ගෙන ලුණු කලවම් කර ගන්නා ඇත්තෝ
ආගම ඒකලූ ආ මඟ මේකලූ සගයට මඟ යැයි කියනා ඇත්තෝ

තුන්සිය හැට පස් දවසේම පල්ලියේ පල්ලියෙ කණු වගේ අපේ ඇත්තෝ
ගෙදර ජරමරේ අල්ලපු ගෙදරට වණයක් වී කුණුවන ඇත්තෝ
නැති බැරි අයෙක් අත් දිග් කෙරුවොත් අත හපනා ගුණමකු ඇත්තෝ
දවසට තුන් හතර වතාවක් මහා අපරාධෙට පපුව පළා ගන්නා ඇත්තෝ

සගයට යන්නට ආගම අදහන ආගම වෙනුවෙන් පණ දෙන ඇත්තෝ
මඟ වැටිලා උන් එකා නොබලනා සමරිතානුවන් නොවනා ඇත්තෝ
ඇති හැකි උන්ගේ කටු රස බලනා දෙවියන් රවටන අපේ ඇත්තෝ
ආගම වෙනුවෙන් පණ දෙන්නට යන සුදුවර සේනා වැනි ඇත්තෝ

හන්දි හන්දි ළඟ සුරුවම් තියලා වැඳ වැඳ දුවනා අපේ ඇත්තෝ
සැර ඒවා දෙක තුන දාගත්තම වැනි වැනි වඳිනා අපේ ඇත්තෝ
පොල් පිති අරගෙන කපා ගත හැකි ආගම අදහන අපේ ඇත්තෝ
සාන්ත කුරුසෙ අඩයාලමේ වරමින් ගලවා ගනු මැන අපේ ඇත්තෝ

මංගල්ලෙට නම් පල්ලි පිරෙන්න ආගම අදහන අපේ ඇත්තෝ
කොඩිගහ ඉඹින්න කිරිබත් කවන්න උපන් හපන් ඇති අපේ ඇත්තෝ
අනෙක් දවස් වල මැස්සෝ ඇහිරෙනා වගේ වගක් නැති අපේ ඇත්තෝ
ආගම ඒකයි දකිද්දි ලෝභයි කවදා හැදෙයිදෝ අපේ ඇත්තෝ

ආගම කියන්නේ තම කම අතහැර කුරුසිය මඟ යාමයි සත්තෝ
ඒ බව දැන ගෙන පුංචි අවදියෙම දරුවන් සැදීම කළ යුත්තෝ
එහෙම නොවුණොතින් පල්ලිය, පන්සල, කෝවිල වැහෙනා බව සත්තෝ
විලිබිය නොතකන, මනුකම නොදන්න ලොවක් හැදෙන බව දැන ගත්තෝ

සූරිය මාමා

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



## කුරුලු අම්මයි, පුංචි කුරුලු පැටව් තුන් දෙනයි ....

මෑතක තරු නැන්දාට එක්තරා ප්‍රාදේශීය ආයතනයක සාහිත්‍ය කලා පුහුණු වැඩමුළුවකට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. මේ වැඩමුළුව සංවිධානය කළ කණ්ඩායමෙන් නැගුණු චෝදනාවක් තමයි, අවට පාසල්වල සිසු සිසුවියන්ටත්, ගුරු භවතුන්ටත් සාහිත්‍ය කලාව සම්බන්ධයෙන් උනන්දුවක් නැති බව. මේ වැඩමුළුවට දරුවන් සහභාගි නොකිරීමත්, වාර්ෂිකව පවත්වන සාහිත්‍ය කලා තරගාවලියට සිසුන් උනන්දු නොකිරීමත් සම්බන්ධයෙන් එක්තරා පාසලකට චෝදනාවක් එල්ල වුණා.

මට නම් ඒ වෙලාවෙ දැනුණෙ විශාල දුකක්. මොකද ඒ නම කියැවුණු පාසලේ දරුවන් එක්ක කියවීම සහ නිර්මාණකරණය ගැන වැඩසටහනක් කරන්න මට අවස්ථාව ලැබුණ නිසා ඒ දරුවන් කොතරම් උනන්දුද, නිර්මාණශීලීද යන්න මම හොඳින් දැනගෙන සිටියා. ඇත්ත, ඒ පාසලට එන්නෙ ප්‍රදේශයේ වැඩි අවධානයට ලක් නොවන නිවාස පේළිවල දරුවන්. ඔවුන්ගේ දෙමව්පියන් එදිනෙදා කුලී වැඩක් කරමින් හෝ යමක් අලෙවි කරමින් ජීවත් වන මිනිසුන්. සමහරවිට සමාජය නීති විරෝධී යැයි සලකන ජාවාරම්වල හවුල්කරුවන්. ඒත් ඒ නිසාම අපට ඒ දරුවන් නොසලකා හරින්නට බැහැ. ඒ දරුවන්ගේ උනන්දුව හෝ නිර්මාණශීලීත්වය පිළිබඳව චෝදනා නගනවාට වඩා අවශ්‍ය වන්නේ, ඔවුන් සමග එක්ව වැඩ කිරීම.

දුවල, පුතාල දන්නවනෙ හැමෝම හැම වැඩේටම දක්ෂ නැති වුණාට හැම කෙනා ළඟම අනිවාර්යයෙන්ම කුමන හෝ හැකියාවක් තියෙනවා කියා. ලියන්න, කියන්න, නටන්න, ගයන්න, වයන්න, සෙල්ලම් කරන්න, නව නිපැයුම් බිහි කරන්න... සමහරවිට අපි නොදන්න, අපි හඳුනානොගත් නොයෙක් දක්ෂතා අප තුළ තියෙන්න පුළුවන්. ඒවා සොයා පාදා ගෙන, වැඩිදියුණු කරගැනීම අපේ වගකීමක්.

ඔන්න එදා දවසෙ ගී ගයන, කවි කියන, රඟන අතරතුර අපි දුන්න එක වැඩක් තමයි මේ. 'ළමයා', 'පොල් ගස', 'ගසේ බෙනය'... මේ වචන තුන සම්බන්ධ කරලා කතාවක් හෝ කවියක් නිර්මාණය කරන්න කියන එක. සමහරු තනි තනිව ලිව්වා. දෙතුන් දෙනා එකතු වෙලා ලිව්වා. සමහරු නොලියා කතාව ඉදිරිපත් කළා. කණ්ඩායමක් විදියට පොඩි නාට්‍යයකුත් කළා. වැඩිහිටියො උනන්දුවක් නෑ කියල චෝදනා නගපු දරුවන්ම කොතරම් උනන්දුවෙන් ඒ පුංචි නිර්මාණයත් එක්ක එකතු වුණාද කියල අපි දැක්කා.

එක පුතෙක් ලියල තිබුණු කතාවක් තමයි මේ.

''ඔන්න අම්මයි, මමයි දවසක් ගමනක් යනවා. එහෙම යද්දි මට ඇහුණා ලස්සණ කුරුලු හඬක්. මම වටපිට බැලුවා. පාර අයිනෙ පොල් ගහක් තිබුණා. ඒ ගහේ බෙනයක් තිබුණා. අර කුරුලු කිචි බිචි හඬ එන්නෙ එතනින්. මම ගහ ළඟට ළං වෙලා බැලුවා. පුංචි කුරුලු පවුලක් ඉන්නවා. කුරුලු අම්මා වෙන්න ඇති, පුංචි කුරුලු පැටව් තුන් දෙනයි. එයාල සතුටින් සිංදු කියනවා. මම ආපහු අම්ම ළඟට ඇවිත් මෙහෙම ඇහුවා.


''අම්මෙ අර කුරුලු පැටවුන්ගෙ ගෙදර එයාල හරිම සතුටින් ඉන්නවා. ඇයි අපේ ගෙදර විතරක් හැමදාම රණ්ඩු වෙන්නෙ...''

ඒ පුතාගෙ නිර්මාණය එච්චරයි. හැබැයි දවසක එයා අපූරු සංවේදී නිර්මාණ කරන දරුවෙක් වේවි. දුවේ පුතේ, ඔයාලත් උත්සාහ කරන්න ඔයාලට මේ වගේ අපූරු නිර්මාණ කරන්න පුළුවන් අනිවාර්යයෙන්ම. ඒ නිර්මාණ අපේ සඟරාවෙ ළමා පිටුවට එවන්නත් අමතක කරන්න එපා.

**තරු නැන්දා**



## ප්‍රහේලිකා අංක - 83



### පහළට

1. වර්තමාන පාප් වහන්සේගේ මව් රට.
2. තමන්ගේ යන අදහස දේ.
3. මරියතුමියගේ පියා.
4. මළවුන් සමරනු වස් දිළිඳුන්ට දෙන දේ.
5. තමන් උපන් ප්‍රදේශය.
8. උදරයේ පිහිටි විශාලතම අවයවය.
9. "ගොරෝසු" යන්නට සමාන පදයකි.
11. ඕනෑම ආගමක් ඇදහීමේදී අත්‍යවශ්‍යම දේ.
14. "උස්කරනවා" යන්නට සමාන අරුත් දෙන "හුවනවා" යන පදයේ ධාතුව.
15. ආහාර අනුභවය සඳහා අත්‍යවශ්‍ය මුඛය හා සම්බන්ධ අවයවයකි.
18. බරක් එසවීමට යොදන දිග දණ්ඩ මේ නමින් හැඳින්වේ.
19. ලෝකයේ පැරණිම බහු දේව වාදී ආගම.
20. ගිනි කඳු පිපිරීමේදී ගලා යන ද්‍රවය.
22. ශු. පාවුලු තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවේදී කිතු දහම වැළඳගත් කාන්තාවකි.
24. තරාදි.

### හරහට

1. බොහෝමයක් ආගම් බිහිවූයේ මේ මහාද්වීපයෙනි.
3. ලෝකයේ පැරණිම ඒක දේව වාදී ආගම.
6. ආගම් ඇදහීම තුළ මිනිස්සු ජීවිතය ........ගැනීමට උත්සාහ කරති.
7. දෙවියන් යැදීම තුළ ඉල්ලීම් අයදිනවාට වඩා අප ....... දෙවියන් වෙතට යොමු කිරීම වටී.
8. "ආකාරය" යන්නටත් "කුඩා දියපාර" යන්නටත් සමාන අර්ථ දේ.
10. කොපමණද?
12. මාළු කල්තබා ගත හැකි ආකාරයකි.
13. බයිබලය තුළ "නපුර" අරක්ගත් ස්ථානයක් ලෙස සැලකූ දෙයකි.
16. දෙවියන් තුළ විවිධ ප්‍රබල ක්‍රියා කිරීමට මිනිස්සු .... ලබති.
17. අපගේ සමහර ඉල්ලීම් සහ අයැදීම් හමුවේ දෙවිඳුන් විසින් .... රකිනු ලබයි.
18. "කෝටුව" යන්නට සමාන වචනයකි.
19. ජේසුස් වහන්සේ හෙරොද් රජුව මේ සතාට සමාන කළ සේක.
21. වඩාත්ම ආගමික රට.
23. ප්‍රධාන වර්ණ 3 න් එකකි.
25. දෙවිඳුන් පිදීමේදී සහ වැඳීමේදී විවිධ ආගම්වල භාවිත වන සුවඳ හා සම්බන්ධ දේ.
26. ලෝකයේ බහුතර පිරිසක් අයිති ආගම.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2025 ජනවාරි. 30** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 83**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 81 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 සේ | ව | 2 ක | ත් | 3 ව | 4 ය | | 5 සි | වි | 6 පා |
| දු | | ම | | 7 ර | ස | දි | ය | | දු |
| 8 මා | 9 ව | ත | 10 ග | ම | | | ඔ | | සේ |
| 11 ව | ස | | ල් | | 12 ඉ | | ලා | | දී |
| 13 ත | ම | ත් | ක | ඩු | ව | | | 14 දු | ම |
| | | | වූ | | 15 සී | 16 නු | 17 ව | | |
| 18 මී | 19 ග | 20 මු | ව | | 21 ම | ව | ත | ල | 22 දු |
| 23 දූ | රා | ව | | 24 දැ | | 25 ණ | ය | | ස් |
| ම | | දෙ | | ක් | | | | 26 මැ | කො |
| | 27 දෙ | ත | | 28 ම | ලා | කි | | 29 ර | ත් |

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email:bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 81 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 81 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභීන් වෙත ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - මිහේලි දෙවන්සා නානායක්කාර, 9 ශ්‍රේණිය, සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07.
- **දෙවන ස්ථානය** - ඉමෙත් ගෙත්මිර ද සිල්වා, 8H, මාරිස්ටෙලා විදුහල, තිඹිරිගස්කටුව, මීගමුව.
- **තෙවන ස්ථානය** - යොෂේන් කරුණානායක, 8 S 5 පංතිය, සා. පීතර විදුහල, කොළඹ 04.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2025 මාර්තු / අප්‍රේල් - "විමුක්තිය"**
(මාර්තු - අප්‍රේල් කලාපය සඳහා ඔබ එවන ලිපි ජනවාරි 25 ට පෙර අප වෙත එවන්න.)
**2025 මැයි / ජූනි - "ඥාන පාත්‍රෙනි"**
(මැයි - ජූනි කලාපය සඳහා ඔබ එවන ලිපි මාර්තු 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

1. 1. සෑම පාපයකටම හේතු වන්නේ කුමක්ද ?
 2. විශ්වාසයේ ජීවිතයක් ගත කළ පුද්ගලයන් දෙදෙනකු නම් කරන්න.
 3. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දෙවියන් වහන්සේට ප්‍රිය පඬුර වන්නේ කවුරුද ?
 4. දරුවන්ට දෙමාපියන්ට අවවාද කර ලිපියක් ලියන්නේ කවුද ?
 5. දරුවන්ට දේව නීතිය අනුව ගමන් කරන්නට මග පෙන්විය යුත්තේ කවුරු ද ?
 6. මව්කුස තුළ තිබෙන කලලය විනාශ කිරීම කීවැනි පණතට විරුද්ධ ක්‍රියාවක්ද ?
 7. දෙවියන් වහන්සේ අපට පවරා ඇති ජීවිතයේ හිමිකරු කවුද ?
 8. දේව මැවිල්ල පාලනය කිරීමේ වගකීම දෙවියන් වහන්සේ පැවරුවේ කා හටද ?
 9. පැරණි ගිවිසුමේ "සාමය" සඳහා භාවිත කරන හෙබ්‍රෙව් වචනය කුමක්ද ?
 10. මරණින් පසු සදාකාලික ජීවිතය ලැබීම සඳහා කුමක් කළ යුතුද ?

2. 1. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමේදී සියලු දෙනා විනිශ්චයට ලක් කරන මිනුම් දණ්ඩ කුමක්ද ?
 2. ආත්මික පුණ්‍ය ක්‍රියා 3 ක් නම් කරන්න.
 3. ස්වාභාවික විපතකින් පීඩාවට පත් වූ අය වෙනුවෙන් ඔබට කළ හැකි පුණ්‍ය ක්‍රියා පිළිබඳ වචන 100 කින් පමණ විස්තරයක් කරන්න.

3. 1. නික්මයාම 20:16 ට අනුව 8 වන පණත නම් කරන්න.
 2. සත්‍ය ගරුකව ජීවත් නොවූ අවස්ථාවක් ගැන බයිබලීය නිදසුනක් දෙන්න.
 3. අටවන දේව පණතට විරුද්ධ පාප 5 ක් නම් කරන්න.

4. 1. සෑම අභියෝගයකදීම දෙවියන් වහන්සේට ප්‍රසංශා කළ තැනැත්තිය කවුද ?
 2. යාච්ඤාවට අමතරව කළ හැකි භක්ති අභ්‍යාස 2 ක් ලියන්න.
 3. පළමු පණතට විරුද්ධ ක්‍රියා 5 ක් නම් කර විස්තර කරන්න.

5. 1. මරිය හමුදාව ආරම්භ කළේ කවුද ?

2. මරිය හමුදාවේ ගිහි ධර්මෝපදේශ ව්‍යුහයේ අරමුණු 3 ක් නම් කරන්න.

3. මරිය හමුදාව මගින් සිදුවන සේවාවන් 5 ක් නම් කරන්න.

**පිළිතුරු**

1. 1. දෙවියන් වහන්සේව නොදන්නාකම. 2. ආබ්‍රහම් තුමා /මරිය තුමිය. 3. බිඳුණු හදවතයි.
4. ශුද්ධවූ පාවුලු තුමා. 5. දෙමාපියන්. 6. පස්වන පණතට. 7. දෙවියන් වහන්සේ.
8. මිනිසාටය. 9. ෂාලොම් (Shalom). 10. පුණ්‍ය ක්‍රියා කළ යුතුවේ.

2. 1. පුණ්‍ය ක්‍රියා.

2. පව්කරුවන් පාපයෙන් හරවා ගැනීම / අඥානයන්ට ඉගැන්වීම / සැක ඇති අයට දැනුමැතිකම් දීම /දුකින් පෙළෙන්නන් සැනසීම / නින්දා අපහාස ඉවසීමෙන් දරා ගැනීම / වැරදි කමා කිරීම. ජීවතුන් හා මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

3. සිසු අදහස්.

3. 1. නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව.

2. අනනියස් සහ සපීරා කතාව.

3. බොරු කීම / කටකතා පැතිරවීම / අසත්‍ය තොරතුරු ප්‍රචාරය කිරීම / කේලම් කීම / බොරු පොරොන්දු දීම / නිල රහස් එළිකිරීම යනාදිය.

4. 1. මරිය තුමිය.

2. දන් දීම / විශේෂ වන්දනා ගමන් යාම.

3. රාහු කාලය අනුව ක්‍රියා කිරීම / සාස්තර ඇසීම / සෙත් ශාන්ති කරවා ගැනීම / යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හූනියම් කිරීම / මූලධර්ම වාදීන් පසුපස යාම / ශුද්ධ ලියවිල්ල වැරදි ලෙස අර්ථකථනය කිරීම.

5. 1. ෆ්‍රෑන්ක් ඩෆ් මහතා.

2. 1. ක්‍රිස්තුන් වහන්සේව පළමුව හමුවී එතුමන් දැන හැඳිනගෙන පරිශුද්ධ ජීවිතයක් ගත කිරීම.

2. මරිය වහන්සේට මුළුමනින්ම ප්‍රේම කර එතුමියව ලොවට හඳුන්වා දෙන පරිත්‍යාගශීලි අරමුණු ඔස්සේ ක්‍රියා කිරීම.

3. යාච්ඤාව හා ක්‍රියාකාරිත්වය තුළින් මරිය භටයාගේ ආත්මික ජීවිතය ශක්තිමත් කර එමගින් සමාජය පාරිශුද්ධවත් කිරීම.

4. මරිය හමුදාවේ ශ්‍රේෂ්ඨ දර්ශනය වන ධර්ම දූත සේවයේ අරමුණ වන ආත්ම ගැලවීම සඳහා ක්‍රියා කිරීම.

3. බාලයන්ට ඉගැන්වීම / සුබාරංචිය සොයමින් ධර්මදානයේ නියැලීම / ජපමාලය තුළින් දේව මාතා බැතිය පැතිරවීම / රෝගීන් බැහැදැකීම / නිවෙස් බැහැදැකීම හා අවශ්‍යතා සොයා බැලීම.

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම VII
## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්
## සුබාරංචිය වර්ගීකරණය

නව ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව 27 කි. ඉන් ග්‍රන්ථ 4 ක් සුවිශේෂය. ඒවා සුබාරංචි ලෙස හැඳින් වේ. ශුද්ධවර මතෙව්, ශුද්ධවර මාර්ක්, ශුද්ධවර ලූක් හා ශුද්ධවර ජොහන් ලෙස නම් කෙරේ. ග්‍රීක වචනයේ ව්‍යවහාරය අනුව සුබාරංචිය සඳහා යෙදෙනුයේ "එව්අංගෙලිඔන්" යන්නය. ඒ වදන් භාවිත කර ඇත්තේ ක්‍රි.ව. දෙවන ශතවර්ෂයේ මැද භාගයේදී පමණය. එලෙස රචනා වූ සුබාරංචි ග්‍රන්ථ සමදර්ශක හා ජොහාන් ලෙස කොටස් දෙකකි.

සමදර්ශක සුබාරංචි

එකම දර්ශනයක්, එකම රටාවක්, සමාන රචනා ශෛලියක් මත ඒ සුබාරංචි ගොඩනැගී ඇත. එහෙත් අරමුණ, කර්තෘත්වය, ලියැවුණ කාලය අනුව වෙනස්කම් ඇත.

ශුද්ධවර මතෙව්

මේ සුබාරංචිය පුරාණ ගිවිසුමේ කරුණු බොහෝමයක් උපුටාගෙන ඇත. නව ගිවිසුමේ සම්මත ග්‍රන්ථාවලියේ පොත් අතර ප්‍රථම පොත මෙය වන්නේය. ග්‍රන්ථය රචනා වී ඇත්තේ ජුදා සමාජ ක්‍රමයක් තුළය. නාසරතයේ ජේසු සම්බන්ධව බොහෝ ඓතිහාසික තොරතුරු මෙන්ම දෙවියන් වහන්සේ තෝරාගත් දේව ජනතාවගේ තොරතුරුද මෙයින් අනාවරණය කර ඇත.

මේ සුබාරංචියේ කර්තෘත්වය සම්බන්ධව විමසීමේදී ඔහු ජුදා සම්භවයක් ඇත්තෙකි. අයකැමියකු ලෙස රෝම අධිරාජයාට සේවය කළ නිලධාරියෙකි. ක්‍රිස්තුස් වහන්සේ ඔහුව හැඳින්වූයේ ලෙවී යන නාමයෙනි. ජුදා ඉගැන්වීම පිළිබඳ දැනුමක් ඇති ඔහු සිරියාවේ අන්තියෝකියේ පදිංචිව සිට ඇත.

මේ සුබාරංචිය රචනා වී ඇත්තේ ක්‍රි.ව. 80-90 වැනි කාලයකයි. ක්‍රි.ව. 70-71 පමණේ දී ජුදා-රෝම කැරැල්ල හේතුවෙන් පලස්තිනයේ සිටි ජුදා ජාතිකයන් තම ආරක්ෂාව පතා සිරියාවේ අන්තියෝකියට ගොස් සැඟවී ඇත. ඔවුන් අතර සිටි පුද්ගලයෙකි මතෙව්. එනිසා සුබාරංචිය ලියවෙන්නට ඇතැයි සැලකෙන ස්ථානය සිරියාවේ අන්තියෝකියයි. එවකට ජුදාවරුන් ගේ කථන බස අරාමීය (ඇරමැයික්) විය. සුබාරංචිය ලියවී ඇත්තේ ඒ බසිනි. පසුව මතෙව්තුමාගේ සංඝය විසින් ඒ සටහන ග්‍රීක් බසට පරිවර්තනය කරනලදි.

ඒ සුබාරංචිය රචනා කිරීමේ දී ප්‍රධාන පරමාර්ථ 3 කි.

1. ක්‍රිස්තුස් වහන්සේ ජුදාවරුන්ගේ අපේක්ෂාව වූ මෙසියස් බව තහවුරු කිරීම.
2. පුරාණ ගිවිසුමේ මෙසියස් පිළිබඳ වූ ඉගැන්වීම නව ගිවිසුමේ සම්පූර්ණ වී ඇති බව පෙන්වීම.
3. ක්‍රිස්තුස් වහන්සේ දහම් ඇදුරාණන් (ගුරුවරයකු) බව පෙන්වා දීම.

සුබාරංචිය දෙස විමර්ශනාත්මක වීමේ දී ආවේණික ලක්ෂණ දෙකක් පෙනේ;

1. පංච පුස්තකයේ ආභාසයක් ගෙන ඇති බව.
2. ජුදාවරුන් අතර සිටි කිතුනුවන් වෙනුවෙන් එම ග්‍රන්ථය ඉදිරිපත් කර ඇති බව.

1. පංච පුස්තකයේ ආභාෂය

මෝසෙස් තුමා පංච පුස්තකය ලියන්නට ඇතැයි එකල ජුදාවරුන් ගේ පිළිගැනීම විය. ඒ ආභාසයට ද අනුව සහ ඊට සමාන්තරව ක්‍රිස්තුස් වහන්සේගේ දේශනා 5 ක් මතෙව් සුබාරංචියේ අන්තර්ගත වේ.

1. ක්‍රිස්තුස් වහන්සේ ගේ ළමා කාලය (මතෙව් 1-2 පරිච්ඡේද)
2. ස්නාවක ජුවාම් පිළිබඳව සහ කන්ද උඩ දේශනය (මතෙව් 3-4 හා 5-7 පරිච්ඡේද)
3. ක්‍රිස්තුස් වහන්සේ ගේ දූත සේවය හා දෙසුම් (මතෙව් 8-9 හා 10-11 පරිච්ඡේද)
4. වදාළ උපමා සහ ප්‍රජාව සමග පැවැත්වූ දෙසුම් (මතෙව් 11,12,13 පරිච්ඡේද)
5. ක්‍රිස්තුස් වහන්සේගේ දේශනා අතර අවසාන විනිශ්චය පිළිබඳ දෙසුම (මතෙව් 10-25 පරිච්ඡේද)

මතෙව් සුබාරංචිය සමාප්ත වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය සම්බන්ධව විස්තරයකින් වේ.

2. ජුදාවරුන් අතර සිටි කිතුනුවන් වෙනුවෙන් ඉදිරිපත් කිරීම

මතෙව් සුබාරංචියේ ජුදාවරුන් අතර සිටි කිතුනුවන් සම්බන්ධව බොහෝ විස්තර ඇතුළත් වේ.

1. ක්‍රිස්තුස් වහන්සේ ගේ පෙළපත ලියා ඇත.

උන්වහන්සේ ආබ්‍රහම්, දාවිත් යන අයගේ පුත්‍රයකු ලෙස ඉදිරිපත් කෙරේ.

2. පුරාණ ගිවිසුම් සම්පූර්ණවීම ක්‍රිස්තුස් වහන්සේගෙන් සිදු වූ බව විස්තර වේ.
3. මෝසෙස් ගේ ව්‍යවස්ථාවට නව අර්ථකථනයක් දී ඇති බව පැහැදිලි වේ.
4. ජුදාවරුන්ගේ සම්ප්‍රදායන් හා පිළිවෙත් ඉදිරිපත් කර ඇත.
5. කන්ද උඩ දේශනාවේ දි උන්වහන්සේ නව ප්‍රේමයේ නීතියක් දානය කිරීම.
6. ක්‍රිස්තුස් වහන්සේ ජුදාවරුන්ගේ රජු ලෙස ඉදිරිපත් කිරීම.
7. ක්‍රිස්තුස් වහන්සේ ශ්‍රේෂ්ඨ ගුරුවරයකු බව පෙන්වා දීම.
8. ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයාය, මනුෂ්‍යය පුත්‍රයාය යන සංකලන දෙකම ඉදිරිපත් කිරීම.

මතෙව් සුබාරංචිය දේව රාජ්‍යය පිළිබඳ ගැඹුරු ඉගැන්වීමක යෙදේ. දේව රාජ්‍යය ජනතාවට තේරුම් කර දීමට විවිධ උපමා භාවිත කර ඇත. අබ ඇටය, මුහුන් පිළිබඳ , නිධානය, මුතුඇටය හා දැල පිළිබඳ උපමා ඒ අතර වේ. දේව රාජ්‍යය සම්බන්ධව ධාර්මික සත්‍යතා 3 ක් මතෙව් පොතේ අන්තර් ගත වේ. දේව රාජ්‍යයේ ප්‍රඥප්තිය, දේව රාජ්‍යයේ විකාශනය, දේව රාජ්‍යයේ ස්වභාවය, ඒවා දේව රාජ්‍යයේ ජීවන රටාව සහ දේව රාජ්‍යයේ අනාගතය ලෙස විග්‍රහ කෙරේ.

ශුද්ධවර මාර්ක්

මේ සුබාරංචියද අයත් වන්නේ සමදර්ශක වර්ගීකරණයටය. දේව රාජ්‍යය ස්ථාපිත කරන්නා ක්‍රිස්තුස් වහන්සේ බව මාර්ක් සුපුවතේ පෙන්වයි. දේව රාජ්‍යය ප්‍රකාශ වීම පිළිබඳව ඒ සුපුවත 13 වතාවක් අනාවරණය කරයි. ඒ සඳහා "නියමිත මොහොත පරිපූර්ණවී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය සුබඅස්න අදහා ගන්න" යනුවෙන් මාර්ක් පොත පෙන්වා දේ.

සුබාරංචිය ග්‍රන්ථ අතර "කෙටිම සුබාරංචිය" මාර්ක් සුපුවත වේ. මාර්ක් පොත ලූක් හා මතෙව් සුබාරංචිවලට මූලාශ්‍රය සපයා ඇත . ඒ සුපුවත් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානයට වැඩි ඉඩක් වෙන්කර ඇති බැවින් දුක්ප්‍රාප්තියේ සුබාරංචිය ලෙස හඳින්වේ.

කර්තෘත්වය

පැපියස්, ඉර්නේයස්, ඔරිගන් යන සභා පියවරුන් පෙන්වා දෙන්නේ මාර්ක් සුබාරංචියේ කර්තෘ පේදුරු තුමාගේ සහායක හා භාෂා පරිවර්තක ලෙස කටයුතු කර ඇති බවය. ඇතැම් විශාරදයන් පෙන්වා දෙන්නේ ඒ පුස්තකයේ කර්තෘ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් ජොහාන් මාර්ක් බවය. තවත් මතයක් වන්නෙ පේදුරු තුමා මාගේ පුත්‍ර මාර්ක් යනුවෙන් ආමන්ත්‍රණය කළේ මෙතුමන්ට බවය. කෙසේ වෙතත් මාර්ක් සුබාරංචියේ කතුවරයා මුල් කිතුනු සභාවේ ඇදහිලි වන්තයෙකු බව පැහැදිලිය. සුබාරංචිය රචනා වී ඇත්තේ ක්‍රි.ව. 65-70 අතර කාලයකය. ඒ යුගයට පසුව එනම් ක්‍රි.ව. 70-71 කාලයේදි රෝම හමුදාව පැමිණ ජෙරුසලම විනාශකර දමා ඇත. පේදුරු තුමන්ගේ මරණය සිදුවීමට පසුව ඒ පොත ලියා ඇති බවට තවත් මතයකින් ප්‍රකාශ වේ. රෝම අධිරාජයෙකු වූ නීරෝ කිතුනුවන්ට පීඩා කළ සමයේ දී කිතුනුවන්ව ධෛර්යවත් කිරීමේ අරමුණින් ඒ පොත රචනාවී ඇත. ඒ රචනා වීම සම්බන්ධව තවත් අරමුණක් වූයේ ක්‍රිස්තුස් වහන්සේගේ මහිමාන්විත දෙවන පැමිණීම සිදුවන බව පැහැදිලි කිරීමය.

මාර්ක් සුපුවතට ආවේණික ලක්ෂණ

- ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයා බවට තහවුරු කරන විශ්වාසයේ ප්‍රකාශනයකි.
- උන්වහන්සේගේ මෙහෙයට හා කුරුසිය මත දිවි පිදීමට විශේෂ තැනක් දී ඇත.
- ප්‍රමාද නොවී ඉක්මන් කරවීමට අවැසි වදන් භාවිත කිරීම. උදාඃ ඒ ඇසිල්ලෙහිම, එකෙනෙහිම යන වචන 40 වතාවක් පමණ භාවිත කර ඇත.
- අපෝස්තලුවරුන්ගේ සැබෑ ජීවිත මාර්ගය පෙන්වා දී ඇත.
- ජුදාවරුන් නොවන සුළු ආසියාවේ දිවි ගෙවූ ජනතාව වෙත සුපුවත රචනා කර ඇත.
- දේව රාජ්‍යය හා යුගානන ධර්මය පිළිබඳව කථා කරයි.

ක්‍රිස්තුස් වහන්සේ මහිමාන්විත දේව පුත්‍රයා මෙසියස් වහන්සේ බව එනම් "මෙසියානික රහස" හෙළිදරවු කිරීමට ශුද්ධවර මාර්ක් තුමා ඒ කෘතියෙන් යත්න දරා ඇත.

සටහන : ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා


TRANSWORLD GLS
CARRYING CARGO WITH CARE
A subsidiary of
TRANSWORLD GROUP SINGAPORE
Air Freight
Liner Agency
Supply Chain Solutions
Sea Freight
Inland Logistics
ISO Tanks
Projects
10 countries
36 offices
BLPL SINGAPORE
BLPL FAITH
BLPL
BEST COMPLIMENTS FROM
TRANSWORLD GLS (LANKA) PVT LTD
Ceylinco Houe, No 69. 8th Floor, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka T.P +94 11 7634170/77 FAX +94 11 2481020
OUR PRESENCE
SINGAPORE
VIETNAM
MALAYSIA
INDIA
MYANMAR
SRI LANKA
THAILAND
CHINA
INDONESIA
AFRICA

# දශක ගණනාවක රැකවරණයේ උරුමය රැගෙන

Union Chemists (Pte) Limited
Total healthcare support
SINCE 1961

SINCE 1961




පුළුල් ඖෂධ පරාසය

විශිෂ්ටත්වය

නව්‍යකරණය වූ සේවාව

"වසර 60කට අධික විශ්වාසය, රැකවරණය සහ සමාජ වගකීම!
ඔබගේ සෞඛ්‍යයෙහි දීර්ඝ කාලීන යහපැවැත්මෙහිලා වන අද්විතීය සේවා විශිෂ්ටත්වයට සහ නොසැලෙන කැපවීමට අප උරුමකම් කියන්නෙමු "

## අපගේ ශාඛා ජාලය

- යූනියන් පෙදෙස-කොළඹ 02 — 076 359 2766
- ඩීන්ස් පාර-කොළඹ 10 — 076 359 2766
- කිරුළ පාර-කොළඹ 05 — 076 359 2767
- ඇල්ෆ්‍රඩ් පෙදෙස-කොළඹ 05 — 076 359 2768
- කාසල් වීදිය-කොළඹ 08 — 077 221 5015
- කළුබෝවිල — 076 359 2770
- වත්තල — 076 359 2769
- තලවතුගොඩ — 076 018 4029

www.unionchemistspharmacy.lk


මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025